THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023|09|03 Vol: 52

# 2024 ජනාධිපතිවරණය



P 10

## රනිල් සමග පෙරමුණක්
## සජිත් තරගයෙන් ඉවතට
## රාජපක්ෂලා පවුලට සීමාවෙයි
## අනුර, ඩලස් හා විමල් තුන් හවුලක



P 08

### මිනිසුන් ඉල්ලා සිටින්නේ තාප්ප වෙනුවට පාලම්ය

### පාස්කු යුක්තියේ දේශපාලන හස්තය

P 04







P 03

### සංවර්ධිත ශ්‍රී ලංකාවක් යෝජනා කරන්නේ රනිල් පමණය

# ජනාධිපතිවරණයට නාමල්ගෙනුත් අපේක්ෂකයෙක්!



2024 ජනාධිපතිවරණය සඳහා තම කඳවුර සහ රට ජයග්‍රහණය කළ හැකි, රටට ආදරය කරන අපේක්ෂකයෙකු ඉදිරිපත් කරන බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ පවසා තිබුණේ මීට මාස දෙකකට ඉහත දී මාධ්‍ය වෙත අදහස් ප්‍රකාශ කරමින්ය. ඉන් පසුව ද අවස්ථා ගණනාවකදී නාමල් විසින් එසේ පවසා තිබිණි. මෙම ප්‍රකාශයේ දිග, පළල, ගැඹුර ගැන මනා අවබෝධයක් සහිතව නාමල් එසේ කියන්නට ඇතැයි සැකයක් නැත. නාමල්ගේ ජනාධිපති අපේක්ෂකයාට පැවරෙන වගකීම් සහ සුදුසුකම් පෙළ ගැස්ම හරි පැහැදිලිය. අංක එක තම කඳවුර ජයග්‍රහණය කරවීමය. දෙක රට ජයග්‍රහණය කරවීමය. තෙවැන්න රටට ආදරය කිරිමය. ඒ අනුව ඔහු කියන ජනපති අපේක්ෂකයාගේ පළමු කාර්යභාරය විය යුත්තේ "තම කඳවුර" රැකීමය. "තම කඳවුර" ජයග්‍රහණය කරවීමය. ඒ අරමුණ සපථ කරනු ලබන අපේක්ෂකයකු මේ දිනවල යුහුසුළුව සොයමින් සිටින බව නාමල්ගේ වැඩ රටාව අනුව රටට පැහැදිලිය.

## රාජපක්ෂවරු සහ පොහොට්ටුව

ඉතාම කෙටි කාලයක් තුළ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපෘති ගණනාවක් හරහා වේගයෙන් ජනතාව අතරට ගෙන ගිය, ඒ ප්‍රචාරක ව්‍යාපෘතින්ගේ සාර්ථකත්වය නිසාම ඉහළම ජනප්‍රසාදයකින් විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළ මෑත කාලයේ ශ්‍රී ලංකාවේ ලාබාලතම වගේම සාර්ථකම පක්ෂය බවට පත් වූයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ එහෙම නැතිනම් පොහොට්ටුව බවට විවාදයක් නැත. ආරම්භයේ පටන් පොහොට්ටුවට නායකත්වය දුන් රාජපක්ෂවරු වගේම ඔවුන් හා ගජමිතුරු සුහදත්වයකින් කටයුතු කළ ව්‍යාපාරිකයන් පිරිසකගේ ද ඇඩ්වර්ටයිසින්කරුවන්ගේ ද අනුහසින් ඉතාම ඉහළ ගණයේ ප්‍රචාරක වැඩපිළිවෙලක් දියත් වූ අතර ඒ හරහා රටවැසි ජන මනස තුළ කාවද්දන ලද අනාගතය පිළිබඳ විශ්වාසය, සාර්ථකත්වය පිළබඳ බලාපොරොත්තුව මෙතැකැයි කිව නොහැකි තරම්ය. අහස උසට නැගි බලාපොරොත්තු කන්දක් හිතේ දරාගෙන මේ රටේ අතිමහත් බහුතරයක් වූ ජනතාවක් සිය ඡන්දය 2019දී පොහොට්ටුවය ලබා දුන්නේ, ඒ සුන්දර බලාපොරොත්තු එකින් එක මහ පොලොවේ ඉෂ්ටවනු ඇතැයි කල්පනා කළ නිසාය. එහෙත් ඉතාම කෙටි කාලයක් තුළ සිය ප්‍රාර්ථනාවන් කිසිවක් ඉටුකිරීමට සිය ඡන්දය ලබා බලයටපත් පාලකයන් අසමත් බව තේරුම් ගත් මෙරට පුරවැසියා අවසානයේ අවබෝධ කොට ගත් පැහැදිලි සත්‍යය නම් ඒ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපෘතිය තුළ අටෝප සාටෝප වියතුන්ගෙන් ආර්ටිෆිෂල් ඉන්ටර්ලිජන්ට් කතා වගේම හිටිගමන් ප්‍රාතීර්භූත වූ නාගලෝක සර්පයන්ගෙන් මනාකොට ආවරණය කොට රට හමුවට ගෙනවිත් ඇත්තේ පරණ පුරුදු රාජපක්ෂවාදයම පමණක් බවය. එසේ තේරුම් ගැනීමේ ප්‍රතිඵලය අති බිහිසුණු වගේම ප්‍රචණ්ඩකාරීව රට පුරා ඇවිලුණු ගිනිදැල් සහ ම්ලේච්ඡ මිනිස් ඝාතන මතින් අවසන් වූ බව නැවත නැවතත් සටහන් කරන්නට වීම ද අතිශය ඛේදජනකය.

ඒ බිහිසුණු ප්‍රතික්‍රියාව අවසානයේ එදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණයේ නාමයෙන් බලයේ රැඳී සිටි රාජපක්ෂවරුන්ට තවදුරටත් බලය රැකගැනීමට නොහැකි වූවා පමණක් නොව එල්ල වූ මහජන විරෝධය හමුවේ බලය අතහැර පළායාමට ද සිදුවිය. කෙසේ වෙතත් පොහොට්ටුවට සිය ඡන්දය භාවිත කළ දස දහසක් පුරවැසියෝ ද එකී මහජන විරෝධයේ ප්‍රබල කොටස්කරුවන් වූ බව අමතක නොකළ යුතුය.

## රනිල්ගේ වැල් පාලමෙන් ගොඩයාම

රාජපක්ෂවරුන් බලය අත්හැර යමින් සිටිය දී එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී වූ රනිල් වික්‍රමසිංහ 2022 මැයි මස අගමැති ධුරය භාර ගත්තේය. ඉන්පසුව තමන් භාරගත් අභියෝගයේ බැරෑරුම්කම රට හමුවේ ප්‍රකාශයක් කරමින් අවධාරණය කර සිටියේය. ඒ මෙසේය,

**"මම භාරගත්තේ අනතුරුදායක අභියෝගයක්. හුණුවටයේ ගෘෂා අනුන්ගේ දරුවෙක් වඩාගෙන වැල් පාලම තරණය කළා. මේක ඊටත් වඩා භයානක අභියෝග යක්. හෙළ ගැඹුරුයි. පතුළ පේන්නෙ නෑ. පාලම හදල තියෙන්නේ තුනී වීදුරුවලින්. අත්වැලකුත් නෑ. මගේ කකුල් දෙකට ගලවන්න බැරි සපත්තු දෙකක් දාල තියෙනවා. ඒකේ අඩියේ තියෙන්නේ තියුණු යකඩ ඇණ. දරුවාව ආරක්ෂිතව එහා පැත්තට අරන් යන්නයි මට තියෙන්නෙ."**

අගමැති රනිල් එසේ කියා සිටියේ, ඔහු වඩාගත් දරුවා කිසිවකු නොව රාජපක්ෂවරු විසින් අර්බුදයකට ඇද දැමූ මේ රටේ ආර්ථිකය බවය. දරුවාගේ හිමිකරුවා අනෙකෙකු වූ නිසාම මේ ගමනේ වගකීම රනිල්ට ද අනතුරුදායක විය. ගරාවැටුණු වැල් පාලම කඩා වැටුණොත් රනිලුත්, රනිල්ගේ දේශපාලනයත් අවසන් වීමට නියමිතව තිබිණි. රටේ ආර්ථිකයත් අවසන් වෙනවා වගේම ආර්ථිකය කඩා වැටුණොත් රටත් රටවැසියාත් විනාශ මුඛයට යනවා සිකුරුය.

එසේ රටේ අභියෝගයට කරගැසූ අගමැති රනිල් දින කිහිපයක් ඇවෑමෙන් ජනපති බවට පත්විය. කොහොම වුණත් දරුවත් කැටුව ජනපති රනිල් ඉතාම කෙටි කාලයක් තුළ තුවාලයක් සීරීමක්වත් නොවී ඒ වැල් පාලමෙන් එගොඩ විය. දැන් දරුවා සිටින්නේ රනිල්ගේ හිමිකාරිත්වය යටතේය. දැන් දරුවා හදාවඩා ගන්නේ රනිල්ගේ පිය සෙනෙහසට යටත්වය.

නාමල් රාජපක්ෂගේ අර්බුදය පැන නඟින්නේ මෙතැන් සිටය. මන්ද රනිල් වැල් පාලමේ කතාව කියද්දී රනිල් විරෝධීන් වගේම රාජපක්ෂ විරෝධීන් කියා සිටියේ, රනිල් මේ වැල්පාලමෙන් එගොඩ කරන්න හදන්නේ රාජපක්ෂ පුත්‍රයා බවය. ඒ අන් කිසිවකු නොව නාමල් රාජපක්ෂ බව කාටූන් ශිල්පීන් විසින් සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරන්නට ද විය. එකී චෝදනාව රනිල් වික්‍රමසිංහට වූ නමුත් ඒ මොහොතේ රාජපක්ෂවරුන්ට එය මහත් අස්වැසිල්ලක් වූ බව නිසැකය. මොකද රටපුරා නැගුණු ජනතා අප්‍රසාදය නිසාම බලය අත්හැර පළාගිය රාජපක්ෂවරුන්ට නැවත මේ රටේ බලය පිළිබඳ පුංචි හරි අවස්ථාවක් උදාවනු ඇතැයි සිතිය නොහැකි වටපිටාවක, නැවත බල සිහිනයක් ඉතිරි වුණා නම් ඒ වැල් පාලමේ දරුවා මෙන් රනිල් වික්‍රමසිංහයන්ගේ උරමත නැග සිය ගමන යා හැකි යැයි නාමල්ලා කල්පනා කිරීම තුළය.

එහෙත් නාමල්ලාගේ බල සිහින බිඳ වැටෙන්නට ගත වූයේ ඉතාම කෙටි කාලයකි. රනිල් තමන්ගේ වැල් පාලමේ

> අගමැති රනිල් එසේ කියා සිටියේ, ඔහු වඩාගත් දරුවා කිසි-වකු නොව රාජපක්ෂවරු විසින් අර්බුදයකට ඇද දැමූ මේ රටේ ආර්ථිකය බවය. දරුවාගේ හිමිකරුවා අනෙකෙකු වූ නිසාම මේ ගමනේ වගකීම රනිල්ට ද අනතුරුදායක විය. ගරාවැටුණු වැල් පාලම කඩා වැටුණොත් රනිලුත්, රනිල්ගේ දේශපාලනයත් අවසන් වීමට නියමිතව තිබිණි. රටේ ආර්ථිකයත් අවසන් වෙනවා වගේම ආර්ථිකය කඩා වැටුණොත් රටත් රටවැසියාත් විනාශ මුඛයට යනවා සිකුරුය.

ගමන සාර්ථක කරගත්තේ, රාජපක්ෂවාදී වැඩපිළිවෙළකින් මේ රට ගොඩගත නොහැකි යැයි රටට පවසා තමන්ගේම වූ වැඩපිළිවෙලක් ඔස්සේ යන ගමනට සහාය දක්වන පිරිසද කැටුව රට වෙනුවෙන් අසීරු පියවර සීරු මාරුවට තැබූ නිසාය. එසේම රාජපක්ෂවරුන්ගේ අඬෝවැඩියාව ද නෝක්කාඩුකම් ද විටින් විට බාධා කිරීම් ද නොසලකා කටයුතු කිරීම නිසාය. රාජපක්ෂලාට තවදුරටත් රනිල් සමඟ මේ ගමන යාමෙන් සිය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි බව තේරුම් ගත්තේ මේ අතරතුරය. මුලින්ම කැබිනට් ඇමතිකම් දහයක් රාජපක්ෂවරු නම් කරන කණ්ඩායමට ලබාදෙන ලෙස ඉල්ලා සිටීම ද, පසුව ප්‍රතිසංස්කරණ පනත් සහ යෝජනා සම්බන්ධයෙන් විවේචන එක් කරමින්ද, පනත්වලට සහාය ලබා නොදෙමින්ද, මගහැර සිටීමෙන් ද රාජපක්ෂවරු සහ ඔවුන්ගේ කණ්ඩායම ජනපති රනිල්ගේ ගමන තවදුරටත් අසීරු කරන්නට වෑයම් කළේය. නාමල්ගේ රාජපක්ෂවාදී ගමන නැවත ඇරඹුණේ ඒ මාවත දිගේය.

## රාජපක්ෂවරු තනිවීම

එළැඹෙන ජනාධිපතිවරණයේ දී අවස්ථානුකූලව තමන් ඇතුළු කණ්ඩායම ඊට සුදුසු අපේක්ෂකයෙක් නම් කරනවා යැයි ද මේ රටේ ඊළඟ ජනාධිපතිවරයා වන්නේ එසේ නම් කරන අපේක්ෂකයා යැයි ද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය නමින් පෙනී සිටින නාමල් රාජපක්ෂ ඇතුළු කණ්ඩායම මේ දිනවල රට හමුවේ කියමින් යයි. එවැනි ප්‍රකාශයක් මහත් වූ ස්වයං විශ්වාසයකින් පැවසුව ද ඊට අදාළ තර්කය ගොඩනගන්නේ ඔවුන්ගේම වූ උපකල්පනයක් මත වීම මෙහි ඇති හාස්‍යයයි. මන්ද රාජපක්ෂවාදී ඇතැමුන් මාධ්‍ය හමු අමතා එකී තර්කය පැහැදිලි කළේ, පොහොට්ටුවට ඡන්දය දුන් හැටනම ලක්ෂයෙන් දහනව ලක්ෂයක් ඉවත්ව ගියත් තවමත් ඔවුන්ට පනස් ලක්ෂයක ඡන්දදායකයන් සිටින බව කියමිනි.

නමුත් "ගෝඨා ගෝ හෝම්" අරගලයත් සමඟ රාජපක්ෂවරු සහ රාජපක්ෂවාදය පිළිබඳ කළකිරුණු පොහොට්ටු ඡන්දදායකයන්ගෙන් සැලකිය යුතු පිරිසක් මේ වන විට ජනපති රනිල් වික්‍රමසිංහට සහ ඔහුගේ වැඩපිළිවෙලට සහාය පළ කරමින් සිටී. තවද එදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජයග්‍රහණයේ වැඩි කොටසකට උරදුන් වියත්මග ඇතුළු ජාතික නිදහස් පෙරමුණේ පිරිස ද ස්වාධීනව දේශපාලනය කරන බව පවසා විපක්ෂයේ කටයුතු කරමින් සිටී. එසේම තවත් ගම් මට්ටමේ සැලකිය යුතු පිරිසක් සමගි ජන බලවේගය සමඟ ද ජාතික ජන බලවේගය සමඟ ද ගොනුවෙමින් සිටින අතර අතිමහත් බහුතර පොහොට්ටු ඡන්දදායකයන් නිශ්ක්‍රීයව, දේශපාලනයෙන් ඈත්ව සිටින බව නාමල් ඇතුළු රාජපක්ෂවාදී කණ්ඩායම ගණන් බලා නොමැති බව පැහැදිලිය. මේ අතර පොදුජන පෙරමුණ නමින්ම මේ දිනවල සිදු වන ඇතැම් ප්‍රදේශයක රැස්වීම් සඳහා නාමල් රාජපක්ෂට හෝ මේ රාජපක්ෂවාදී නියෝජිතයන්ට හෝ සහභාගී වීමට ඉඩ නොදීමේ ප්‍රවණතාවයක් ඇතිව තිබේ. පසුගියදා මීරිගම පැවැති පක්ෂ ආසන බල මණ්ඩලයේ රැස්වීමට නාමල්ට සහභාගී වීමට ඉඩ ලබා දී තිබුණේ නැත.

එසේම "මයිනා ගෝ හෝම්" යන්න අරගලයට එක් වූයේ මහින්ද රාජපක්ෂ පිළිබඳ තිබූ ජනතා විරෝධය සංඛේතවත් කිරීම වෙනුවෙන් මිස නැවත සිංහයකු ලෙස පිළිගැනීමට නොවේ. නාමල් පසුගිය දවසක කියා සිටියේ වසරකට පෙර තමන් හැඳින්වූයේ පොඩි මයිනා යන්න දැන් පොඩි සිංහයා ලෙස වෙනස් කර කතා කරන බවය. ඇත්තම කතාව නාමල්ට පොඩි සිංහයා යනුවෙන් ආමන්ත්‍රණය කරනවාය කියන එක ප්‍රචාරක මෙහෙයුමක් මිසක් අනෙකක් නොවේ. තම කඳවුර තුළ හෝ තමන්ට එසේ නාමකරණයක් ගොඩනගා ගැනීමට නාමල් උත්සහ කළ ද පොදුවේ රටවැසියා 'පොඩි මයිනා' යනුවෙන් නාමල්ට ආමන්ත්‍රණය නොකරනු ඇතැයි කල්පනා කිරීම විහිළු සහගතය.

එවන් තත්ත්වයක් රට තුළ ඇති මොහොතක නාමල් ඇතුළු කණ්ඩායමේ ගණන් බැලීම මොනතරම් ප්‍රමාණයකට වුවද මුළු රටම ආර්ථික අගාධයකට ඇද දැමූ රාජපක්ෂවාදී ප්‍රතිපත්ති වෙනස් නොකරගත් කණ්ඩායමකට කඳවුර රැකගැනීම වෙනුවෙන් නැවතත් රටවැසියා ඡන්දය පාවිච්චි නොකරනු ඇත. මේ රටේ පාලන බලය අත්කර දීමට රටවැසියන් සිය කැමැත්ත පළ කරාවි යැයි විශ්වාස කිරීම යනු ඔවුන්ගේ අවමානසිකභාවය පිළිබඳ ප්‍රශ්නයකි. මේ තත්වයන් හමුවේ නාමල්ලාගේ දේශපාලන වුවමණාවන් තුළ සබුද්ධිකභාවයක් තිබේ නම් ඉදිරි ජනාධිපතිවරණයේදී විය හැක්කේ නාමල් විසින්ම තම කඳවුර වෙනුවෙන් වෙනත් අපේක්ෂකයකු නම් කිරීමය. මන්ද තමන්ගේ ජාම යන්තමින් හෝ බේරාගැනීමට වෙන විකල්ප නැති බැවිනි. ඒ කවරක් වුවත් එදා පොහොට්ටුවට ඡන්දය ලබාදුන් අතිබහුතරයක් අද රාජපක්ෂවරු ප්‍රතික්ෂේප කර ඇති තත්වයන් හමුවේ තවදුරටත් නාමල්ලා ගෙන යන මේ රාජපක්ෂවාදී පටු කඳවුරුකරණය නිසා රාජපක්ෂවරු දේශපාලනිකව හුදකලාභාවයට පත් වෙමින් ක්ෂය වීම වැළැක්වීමට නොහැකි වනු ඇත.

නවන් පතිරත්න

# සංවර්ධිත ශ්‍රී ලංකාවක් යෝජනා කරන්නේ රනිල් පමණය

"සංවර්ධිත රටක් දක්වා ශ්‍රී ලංකාව ගොඩනැංවීම" ඉලක්කය කරගත් දේශපාලන නායකත්වයක් දැන් රටට ලැබී තිබේ. මෙය විශේෂයෙන්ම අවධාරණයෙන් සඳහන් කළේ සංවර්ධිත රටක් ගොඩනැංවීමේ ඉලක්කය පසෙකලා වෙනත් බහුබූත වුවමණාවන් වෙනුවෙන් ආණ්ඩුකරණය සංවිධානය වීමේ මෑතකාලීන ප්‍රවණතා තිබීම නිසාය. මේ යුගයට පෙර අවසන් වරට මෙරටට ඇත්ත සංවර්ධන ඉලක්කයක් ගෙන ආවේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසිනි. නමුත් ඔහුගේ එම ඉලක්කය ජයගැනීමට ඉඩ නොදෙමින් එල්ල වූ මාරාන්තික විරෝධයන් හමුවේ එය පූර්ණ සාර්ථකත්වය කරා ගෙන ගියේ නැත. අතර මඟ නැවතිනි. යළිත් ඒ සංවර්ධිත රටක ඉලක්කය ගෙන ආවේ රනිල් වික්‍රමසිංහ විසිනි. ඒ මුල් වරට යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන හරහා ප්‍රසිද්ධ කරනු ලැබූ නමුත් එය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලැබුණේ නැත. යහපාලන යුගයේදීද මෙම ඉලක්කය වෙත යැමට ගත් උත්සාහය ඇතුළතින් මෙන්ම පිටතින්ද එල්ල කළ බාධා කිරීම් හමුවේ අහවර විය. රටත් බංකොලොත් වෙන තැනට පත් කිරීමට ඒ බාධා කිරීම් දුර දිග ගොස් තිබිණි.

අද ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ රට ඉහළ සංවර්ධිත තලයකට ගෙන ඒම ඉලක්ක කරගත් වැඩසටහනක් යළි ක්‍රියාත්මක කරමින් තිබේ. එය සිදු කළ හැක්කේ රනිල් පමණක් බවට වන විශ්වාසය ද අද ජනතාව තුළ ගොඩනැඟීම නිසා ඔහුගේ වැඩපිළිවෙලට ජනතා අනුමැතියද නිරායාසයෙන්ම ලැබී තිබෙන බවත් පෙනෙන්නට තිබේ. මීට පෙර සිටි බොහෝ පාලක කණ්ඩායම්වල වුවමණාව වූයේ රටේ සංවර්ධනය නොවේ. ඔවුන්ට තිබුණේ කෙසේ හෝ පැවැත්ම සහතික කරගැනීම වෙනුවෙන් ජනප්‍රිය සටන් පාඨ, සහන මළු දේශපාලනය, ඇස් ගිනි කන වැටෙන මල් වෙඩි සංදර්ශන මතින් ගෙන ගිය සිල්ලර දේශපාලනයකි. වරෙක සංවර්ධනය වෙනුවෙන් ගත යුතු උපාය උපක්‍රම පසෙකට දමා, ජේ.ආර්. ජයවර්ධන ගොඩනැගූ ආර්ථික වැඩපිළිවෙල 17 වසරක සාපය අවසන් කරනවාය කියමින් පසෙක දමා, විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දීමට ගොස් ඇන ගත්තේය. තවත් වරෙක බොරු දේශප්‍රේමී ජාතිකවාදී සටන් පාඨ කරලියට ගෙන වර්ගවාදී වුවමණාවන් වෙනුවෙන් ආණ්ඩු කරන්නට ගියේය. සංවර්ධනයේ නාමයෙන් කොමිස් ජාවාරම් සිදු කළ අතර රට ණය උගුලකද සිරකරන ලදී. රට දූෂිතම හා ත්‍රාඩ රාජ්‍යයක් බවට පත් විය. ජාතීන් අතර වෛරය පතුරුවා රටම භේද බින්න කරන ලදී. ජාතික ආරක්ෂාව රකින්නට කියා ආණ්ඩු හැදූ පිරිස් සිස්ටම් හදනවා කියමින්, සිය රට දේ සිරි සැප දේ සෙල්ලම කරන්න ගොස් අවසානයේ තමන්ටවත් ආරක්ෂාව සහතික කරගන්නට නොහැකිව ආණ්ඩු අතැරදමා රටෙනුත් පලා යන තැනට පත් විය. ආහාර ඖෂධ ඉන්ධන පොහොර හිඟයෙන් රට බැට කෑවේය. රාජ්‍ය ආදායම්, විදේශ විනිමය ආදායම් නැත්තටම නැති කර තිබිණි. රට බංකොලොත් කළේ නැවත ගොඩනැඟීමක් ගැන හිතන්නටවත් බැරි තරම් ආගාධයකට තල්ලු කරමිනි.

රනිල් රට භාර ගත්තේ ඉන් පසුවය. එතැනට වට්ටවනු ලැබූ රාජ්‍යයක් යළි සංවර්ධනයේ මාවතට ඇද දැමීම පහසු වූයේ නැත. සියල්ලට පෙර රට යළි හුස්ම ගන්නා තත්වයට පත්කිරීම විය යුතු තිබිණි. තුවාල සුවපත් කරගත යුතු විය. ඒ වෙනුවෙන් නිසි වෙද හෙදකම් රැසක් කිරීමට සිදු විය. මෙම අභියෝග ජය ගෙන අද යළි රට දෙපයින් සිටුවා සීඝ්‍ර සංවර්ධනයක් ඉලක්ක කරගත් මාවතට රට ගෙන ඒමට ජනාධිපති රනිල් සමත්ව තිබේ. ඔහුගේ දේශපාලනික සටන් පාඨ වල රටේ සංවර්ධනයෙන් මෙපිට සිල්ලර ජනප්‍රිය වුවමණාවන් සපුරාගැනීම ගැන කියවෙන්නේ නැත.

මීට දින කිහිපයකට පෙර ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන දිශානතිය පිළිබඳ විද්වත් සමුළුවට සහභාගි වෙමින් ඔහු පවසා සිටියේ, "**... ශ්‍රී ලංකාව මුහුණ දුන් ණය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මෙරට ආර්ථිකය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කිරීමට අප බලාපොරොත්තු වනවා. ඒ සඳහා දැනටමත් පියවර ගනිමින් සිටිනවා. එහිදී තායිලන්තය, ඉන්දුනීසියාව, වියට්නාමය වැනි රටවල් ගමන් කළ මාර්ගය අනුගමනය කිරීමට අප අපධානය යොමු කර තිබෙනවා. එහිදී අපට ඉහළ තරඟකාරී ආර්ථිකයක් සහිත රටක් බවට පත්වීමට හැකියාව ලැබෙනු ඇතැයි මම විශ්වාස කරනවා.**




**අපට තවදුරටත් පෙර සිටි අන්දමින් කුඩා ආර්ථිකයක් ලෙස කටයුතු කළ නොහැකියි. අප අපේ ආර්ථිකය පුළුල් කරගත යුතුයි. එහිදී නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කළ යුතු වෙනවා. ඒ වගේම මේ සඳහා අවශ්‍ය විදේශ ආයෝජන සහ ප්‍රාග්ධනය සපයා ගත යුතුව තිබෙනවා.**

**එසේම අප අනෙකුත් රටවලට බරක් නොවිය යුතුයි. අප රටක් ලෙස තවදුරටත් අන් රටවල් මතම රැඳී නොසිටිය යුතුයි. අපේ රටේ දියුණුව අපම උදා කරගත යුතුයි. ලෝකයේ බොහෝ රටවල් එය සිදු කර තිබෙන අතර යුද්ධයකින් සම්පූර්ණයෙන්ම විනාශ වූ වියට්නාමය ඒ සඳහා උදාහරණයට ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.**

**අපේ රට පිහිටා තිබෙන්නේ ඉන්දියන් සාගරය සහ පැසිෆික් සාගරය අතර ප්‍රදේශයකයි. එබැවින් අපට ආර්ථික වර්ධනය උදාකර ගැනීමේ බොහෝ අවස්ථා පවතිනවා. අප සිටින නැගෙනහිර ආසියා-වේ සහ අග්නිදිග ආසියාවේ අද පුළුල් වර්ධනයක් සිදුවන බව ඔබ දකිනවා. ඉන්දිය-ාව අද ආර්ථික වශයෙන් ශක්තිමත් වෙමින් සිටිනවා. ඉන්දියන් සාගර කලාපය, ඉදිරියේ දී ඉහළ ආර්ථික වර්ධනයක් ඇති කලාපය බවට පත් වෙනවා.**

**දැන් අප සියලුදෙනාටම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, දේශගුණික විපර්යාස අවම කිරීම මෙන්ම ගෝලීය ණය අර්බුදය පිළිබඳ සමාලෝචනය කිරීමට කාලය උදා වී තිබෙන බව කිවයුතුයි. අප එයින් බැහැර නොවිය යුතුයි. එහිදී සාමුහිකව සහ කණ්ඩායමක් ලෙස කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අප කණ්ඩායමක් ලෙස නව උපාය මාර්ග ඔස්සේ ඉදිරියට යාමට එක්වන ලෙස මම සියලුදෙනාට ආරාධනා කරනවා...**" යනුවෙනි. ජනපතිගේ දැක්ම පැහැදිලිය.

එසේම පසුගියදා නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ දී ඔහු නව ඉසව්වකට පාසල් දරුවන් නැතිනම් රටේ අනාගතය භාර ගැනීමට සිටින පරපුර කැඳවීම සිදු කළේය. මෙය අතිශය වැදගත් පියවරක් ලෙස සැලකිය හැකිය. මෙරට සංවර්ධන ඉලක්කය ජයගැනීමට නම් මෙරට තරුණ පරපුර ලෝකය සමඟ වන බරපතල ගනුදෙනුවකට යැම සිදුවිය යුතුය. විශේෂයෙන්ම ගෝලීය ප්‍රාග්ධන වෙළඳ පොළට පිවිසිය යුතුය. එය කට වචනයෙන් දෙඩවීමකට සීමා නොකර ඒ සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක්ද සකස් කර ඊට දරුවන් යොමු කිරීමට ජනාධිපතිවරයා කටයුතු කර තිබිණි. මෙහිදී පාසල් සිසුන්ගේ දැනුවත්භාවය සහ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණින් තෝරාගත් පාසල් 100ක "**ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ**" පිහිටුවීමේ වැඩසටහන ආරම්භ කළේය. එහිදී සිසුන් සහ ගුරුවරුන්ට සිංගප්පූරුවට ගොස් එරට කොටස් වෙළෙඳපොළ පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කරගැනීමට අවස්ථාව උදාකර දීමටත් පියවර ගෙන තිබේ. එමෙන්ම මෙම වැඩපිළිවෙල තවදුරටත් ව්‍යාප්ත කරමින් මෙම වසර තුළදීම දිවයින පුරා තවත් පාසල් 200-300ක් අතර ප්‍රමාණයක ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ පිහිටුවීමේ වැඩසටහන ව්‍යාප්ත කිරීමට අවශ්‍ය සැලසුම් සකස්කර තිබෙන බවත් ප්‍රකාශයට පත්විය.

මෙම වැඩපිළිවෙල මඟින් අනාගත සංවර්ධිත ශ්‍රී ලංකාව යනු කවරාකාර මුහුණුවරක් ගන්නා රටක්ද යන්න ගැන ඉඟියක් සපයා ඇත. ලෝකය ජයගැනීම එහි ඉලක්කයය. ජනාධිපතිවරයා ශ්‍රී ලංකා ආර්ථිකය සම්පූර්ණයෙන්ම ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තු වන බව කිහිපවතාවක්ම අවධාරණය කර තිබූ අතර ඒ සඳහා දැනටමත් පියවර ගෙන තිබේ. මේ අනුව ගෝලීය තරඟකාරිත්වයට මුහුණ දෙමින් නව (ජාත්‍යන්තර) වෙළෙඳපොළ, විදේශ ආයෝජන සහ ප්‍රාග්ධනය ආකර්ෂණය කරගැනීම මෙම ඉලකක් සහගත වැඩපිළිවෙලෙහි ප්‍රමුඛම අංශ වේ. එමෙන්ම ලෝකය මුහුණ දෙමින් තිබෙන දේශගුණික විපර්යාස අර්බුදය මෙන්ම ගෝලීය ණය පිළිබඳ අර්බුදය රටට හිතකර ලෙස විසඳා ගැනීම වෙනුවෙන් බරපතල ජාත්‍යන්තර මෙහෙයුමකද ජනාධිපතිවරයා යෙදී සිටී. එම තත්වයන්ද රටේ සංවර්ධනය හා කෙලින්ම බැඳී තිබෙන අතර ඒ වෙනුවෙන් රට සූදානම් කිරීමද ඔහු කරපිටට ගෙන ඇත.

රටේ දේශපාලන බලය අත්පත් කරගැනීමට, ජනාධිපති සිහිනවල වෙලී සිටින විපක්ෂ කණ්ඩායම් විසින් තමන්ගේ දේශපාලන ඉලක්ක ලෙස ඉදිරිපත් කරන කරුණු පෙළ ගස්වා බැලූ විට, රට සංවර්ධනය කරමින් ජනතාවගේ ඇත්ත අභිලාශයන් පූරණය කිරීමෙහි ඉලක්ක ඒ තුළ දකින්නට නැත. රට සංවර්ධනය කිරීම ගැන ඇතැමුන් කියන්නේ වංචාව දූෂණය නවත්වා, හොරකම් කළ ධනය මෙරටට රැගෙන ආ විට රට සංවර්ධනය වන බවය. ජනතාවට සහන මළු පිට මළු ලබා දීමෙන් රට සංවර්ධනය වන බවය. බදු සහන දුන් විට රටේ ආර්ථිකය මේම මේම වර්ධනය වන බවය. පාසලකට බස් රථයක් දුන් විට රටේ සංවර්ධනය වේගවත් වීම සිදුවෙන බවද ඇතමෙක් සිතා සිටිති. සමුපාකාරයේ බඩු විකුණා ලාභ අරන් පෙන්නුවාම ඒ වගේ රටේ ආර්ථිකයත් ලාභ කරන්න පුලුවන් බව ද කියමින් තිබේ. නගර සභා මැතිවරණයක් දිනලා රටත් දිනවන්න පුලුවන් බව කියති. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්නේ නැතුව තමන්ගේ යාලුවන්ගෙන් ඩොලර් 500 ගානෙ ගෙන්වා ගත්තාම රට දියුණු කළ හැකි බව කියති. මේ ආකාර නන්දෙඩවිලි රැසක් මේ විපක්ෂය කරමින් සිටී. මේවා රටක් සංවර්ධනය කිරීම සමඟ සම්බන්ධයක් නැත. නමුත් මේ සිල්ලර වැඩවලින් තමන්ගේ ඡන්දගොඩ වැඩි කර ගැනීමට හැකි බව නම් විපක්ෂය කල්පනා කරනවා විය හැකිය.


කොහොම නමුත් ජනාධිපති රනිල්ගේ මුලිකත්වයෙන් සිදු කෙරෙන ආර්ථික ප්‍රතිසංස්කරණයන්ටත් මේ අය සහමුලින්ම විරුද්ධය. එය වැලැක්වීමට දන්නා දහන් ගැට සියල්ලම දමමින් තිබේ. ආර්ථික ප්‍රතිසංස්කරණ යටතේ වන දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ද එරෙහිය. පසුගිය සතියේදී මේ ණය ප්‍රතිවුහගත කිරීම සිදුවුවහොත් සේවක ආර්ථ සාධක අරමුදල නැත්තටම නැතිවී යන බවත් එහි සාමාජිකයන්ට ප්‍රතිලාබ කපා හැරෙන බවටත් ආදී වශයෙන් ගණන් හදා, ප්‍රස්තාර වගු ගසා මහා ප්‍රචාරක ව්‍යාපාරයක්ද දියත් කර තිබිණි. නමුත් එය පදනමක් නැති බොරු බේගලයක් බව සමාජ මාධ්‍ය ඇසුරු කරන සාමාන්‍ය මිනිසුන් විසින්ම පැහැදිලිව තර්කානුකූලව පෙන්වා දී තිබිණි. මේ බේගල්කාරයෝ කිහිප දෙනෙකු මහ බැංකුව ඉදිරිපිටට ගොස් "**මහ බැංකු අධිපතිට එන්න කියාපියෝ, මේවාට උත්තර දෙන්න කියාපියෝ**" කියමින් මහා අරගලයක් දියත් කිරීමටද කටයුතු කර තිබූ නමුත් මහ බැංකු අධිපතිවරයා සියලු ප්‍රශ්නවලට උත්තර දෙන්නම් සාකච්ඡාවට එන්නැයි ආරාධනා කළ විට එයට සහභාගී වන්න කිසිවකුත් ගියේ නැත. ඒ ගියා නම් ඔවුන් කළ බොරුව හෙළිදරව් වීම නිසැකවම සිදු වීමට නියමිත විය. විපක්ෂයේ අනෙක් සටන් පාඨ ගැනද කතාව එයය. බොරු තොරතුරු දත්ත පෙන්වා බොරු තර්ක මතු කරමින් ජනතාව නොමඟ යැවීම හැර වෙන කිසිදෙයක් ඒවායේ නැත. රජය ආර්ථික ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන්ට එරෙහිව ගෙන ආ සියලු ප්‍රහාරයන් නිකම්ම පුස් වෙඩි වී ගිය අයුරු පසුගිය කාලයේ පැහැදිලිව ජනතාවට දැක ගන්නට හැකිව තිබිණි. මෙහෙව් විපක්ෂ කණ්ඩායම්වලට රටක් සංවර්ධනය කිරීම කිසිසේත්ම සිදුකළ නොහැකි බව පැහැදිලිය. රට මුහුණ දෙන අර්බුද කිසිවකට අඩුම තරමින් සාකච්ඡාවකට ගන්න තරමින් වත් විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමක් මෙතෙක් විපක්ෂය සිදුකර නැත. තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශන මැයෙන් විටින් විට ප්‍රකාශයට පත්කරන කියැවිලි ලියැවිලිවල තිබෙන තරමකට ඇත්තේත් කලින් කී ලෙසම සිල්ලර ජනප්‍රිය සටන් පාඨ මිසක් රටේ සංවර්ධනය ඉලක්ක කරගත් නිශ්චිත උපාය මාර්ග වැඩපිලිවෙල හෝ ප්‍රතිපත්ති කිසිවක් නොවේ.

එහෙත් මේ ජනප්‍රිය කියැවිලි ලියැවිලි කිසිවක් නොමැතිව ජනාධිපතිවරයා රට හමුවේ රටේ ඇත්ත තත්වය පහදා දී ඒ වෙනුවෙන් ගන්නා විසඳුම් ක්‍රියාවලිය ගැන පැහැදිලිව සඳහන් කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරමින් තිබේ. සංවර්ධිත රටක් කරා යන් මාර්ග සිතියම පෙන්වා තිබේ. ඒ මඟ යමින් තිබේ. ඒ සඳහා වන අධිෂ්ඨානය කැපවීම පෙන්වා තිබේ. එහි සාර්ථකත්වයන්ද අද රට අත්විඳිමින් ද තිබේ.

ජනාධිපතිවරයා රටේ ආර්ථිකය නංවාලීමෙහි අනෙක් වැදගත්ම අංශ දෙක ලෙස හඳුනාගෙන ඇත්තේ සංචාරක ව්‍යාපාරය සහ කෘෂිකර්මාන්තයය. සංචාරක ක්ෂේත්‍රයේ දැවැන්ත වර්ධනයක් අපේක්ෂා කරමින් නව සැලසුම්, වැඩසටහන් රැසක් මේ වන විට ආරම්භ කර තිබේ. මේ මඟින් රටට විදේශ විනිමය ගලා ඒම වර්ධනය වනු ඇත. අපනයනය ඉලක්ක කරගත් කෘෂි ක්ෂේත්‍රයේ නවීකරණය වෙනුවෙන් දිර්ගකාලීන සැලසුම් සකස් කරමින් තිබේ. විශේෂයෙන්ම ලෝකය තුළ ආහාර සඳහා වන ඉල්ලුම සහ හිඟ තත්වය අනුව මෙරටට සිදුවිය හැකි බලපෑම් අවම කිරීම සහ ලෝක අවශ්‍යතාවය සපුරාලීමට දායකවෙමින් රටට විදේශ විනිමය ඉපැයීමේ නව මාර්ග යක් විවෘත්ත කරගැනීම මේ අනුව සිදුවේ. එසේම විදේශ ප්‍රේශන ඉලක්ක කරගත් වැඩපිළිවෙලකටද අවතීරණය වී ඇත. වෘත්තිකයන්, පුහුණු ශ්‍රමිකයන් ගොඩනගා ලෝකයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය සපුරාලීමෙන් විදේශ ප්‍රේශන වර්ධනය කරගැනීමට මෙන්ම රට තුළ බුද්ධි ජනනයට ඉවහල් වන්නකි. එමෙන්ම දකුණු ආසියානු කලාපයේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාබ මෙරටට අත්පත් කරගැනීම වෙනුවෙන් අවශ්‍ය උපාය මාර්ගික වැඩපිළිවෙලට පිවිස ඇත. ඉන්දියාව ප්‍රමුඛ කලාපීය රාජ්‍යයන් සමග සහසම්බන්ධිය ආර්ථික ක්‍රියාවලියකට අවශ්‍ය පියවර ගෙන ඇත. කලාපයෙන් පිටතත් ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කරගනිමින් බහුපාර්ශ්වීය සහ ද්විපාශ්වීය වෙළඳ ගිවිසුම් හරහා රටට විදේශ විනිමය ඉපැයීමේ මාර්ග විවෘත්ත කරගනිමින් තිබේ. මේ ආදී වශයෙන් ගෙන තිබෙන පියවර සියල්ලේ අවසාන ප්‍රතිපළය වන්නේ රට සංවර්ධිත රාජ්‍යක් ලෙස ගොඩනැගීමය. එහි සකලවිධ ප්‍රතිලාබයන් මේ රටට මිස ජනාධිපතිවරයාට හෝ ඔහුගේ පාර්ශ්වික දේශපාලනයකට හෝ නොවේ. කෙසේ නමුත් මේ පියවර කිසිවක් ජනප්‍රිය හෝ පහසු දේශපාලන තේරීමක් නොවේ. ඒ මෙම ක්‍රියාදාමය සාර්ථක කරගැනීමේ දුෂ්කරතාවයන් අභියෝගයන් රැසකට මුහුණ දීමට සිදුව ඇති නිසාය. විශේෂයෙන්ම මෙරට විපක්ෂ දේශපාලන කල්ලි කණ්ඩායම් වල බාධා කිරීම් කඩාකප්පල් කිරීම් මධ-්‍යයේ මෙම ඉලක්ක ජය ගැනීමට සිදුව ඇති බැවිනි.

සෝෂක

# පාස්කු යුක්තියේ දේශපාලන හස්තය




පාසුගිය ඉරිදා දින තේවත්ත බැසිලිකා පල්ලියේ රෝගීන් ආසිරි ගැන්වීමේ දේව මෙහෙය පැවැති අවස්ථාවේදී අගරදගුරු කාදිනල් මැල්කම් හිමිපාණන් විසින් කළ ප්‍රකාශයක් හේතුවෙන් 2019 වසරේ වූ පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් නැවත වරක් සමාජ කතාබහක් මතුව ඇත.

*"... අද මා විශේෂයෙන් මෙතන සඳහන් කරන්නේ පාස්කු ප්‍රහාරය පිළිබඳ තත්වය, අද විසඳුනාද? නෑ. තාමත් කිසිම පරීක්ෂණයක් ඒ පාස්කු ප්‍රහාරය ගැන මේ අය සංවිධානය කළේ නෑ. කිසිම පරීක්ෂණයක්. ඒ හැම පරීක්ෂණයක්ම යටගහල, ඒගොල්ලන්ට ඕනෙ විදිහේ මත ඉදිරිපත් කරල, පාස්කු ප්‍රහාරයේ සැබෑ මහමොලකරුවන් සඟවන්නට මේ දේශපාලන නායකයො කටයුතු කරමින් ඉන්නවා.*

*...අපේ සහෝදර ජනතාව දෙසිය හැත්තෑ තුන්දෙනෙකුගේ ජීවිත විනාශ කරල, තවත් පන්සියයක් පමණ දෙනෙකුගේ ජීවිත අසරණ තත්වයට පත් කරපු ඒ විනාශය පිටිපස්සෙ ඉන්නෙ කවුද කියන එක වැඩිකල් නොගොස් අපිට එළිදරව් කරන්න කියලා අපි ස්වාමීන් වහන්සේට යාඥා කරන්න ඕනේ..."*

කොහොම වුණත් කාදිනල් උන්නාන්සේ මේ කියන විදියට පසුගිය හා වත්මන් රජයයන් විසින් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිඳු පියවරක් අරගෙන නැහැ. කිසිම පරීක්ෂණයක් කරලත් නැහැ. හැබැයි, මේ තත්වයන් පිළිබඳ වගකිවයුතු පාර්ශ්වය වෙච්ච රජය වෙනුවෙන් මහජන ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ටිරාන් අලස් පහුගිය දවසක කිවුවේ වෙනමම කතාවක්.

*"පාස්කු ප්‍රහාරයේ රහස් පොලිසියේ විමර්ශන මේ වෙන කොට 99%ක් අවසන් කියන තැන තමයි රහස් පෙලිසිය ඉන්නේ. නමුත් කතෝලික ප්‍රජාව පැත්තෙන් සමහරු කියනව මේක හරියට කරල නෑ කියල. ඒ නිසා අවුරුදු ගාණක් තිස්සේ රිපෝට් එකක්වත් දුන්නෙ නෑ කියපු නිසා තමයි මම ජනාධිපතිතුමාගේ එකඟත්වය උඩ මුළු රිපෝට් එකම කතෝලික සභාවට භාර දුන්නේ.*

*භාර දෙනකොට මම කිවුවා, ඊට ඉස්සෙල්ලත් කිවුවා අපිට අවස්ථාවක් දෙන්න දැනට කරල තියෙන දේවල් ගැන කියන්න අවස්ථාවක් දෙන්න කියලා. ප්‍රහාරයට කළින් ඉඳන් මේ වෙනකං කරල තියෙන ඒව ප්‍රසන්ට් කරන්න අවස්ථාවක් දෙන්න. එතකොට පුළුවන් කතෝලික සභාවට හරි බිෂොප්තුමන්ට හරි කාට හරි මේ සියලු දේ බලල ඒ අයට හිතෙනව නං මොනව හරි තැනකදි අතපසුවීමක් වෙලා තියෙනව කියලා ඒවත් පෙන්නල දීලා, අපි ඔක්කොටම එකට එකතුවෙලා මේක දිහා හරියට බලල මේක ඉවරයක් කරමු කියලා.*

*අවාසනාවට වගේ අද වෙනකං අපිට ඒ අවස්ථාව ලැබිල නෑ. වෙන වෙන න්‍යායපත්‍රවල ඉන්න උදවිය මේක ගැන කතා කර කර මේක දිගටම ඇදගෙන යනවා. නමුත් මම හැමතිස්සෙම කියන්නේ කතෝලික සභාවටද, නැත්තං කතෝලික ප්‍රජාවටද ඇත්තටම උවමනාවක් තියෙනව නං මේක කෙරුවෙ කවුද? කොහොමද වුණේ කියන එක දැනගන්න, මේ අය අපි එක්ක එකතුවෙලා, පොලිසිය එක්ක එකතුවෙලා මේ මුළු ඉන්වෙස්ටිගේෂන් එක දිහාම බලන්න ඕනේ. ඇත්තම උවමනාව ඒක නං එහෙමයි කරන්න ඕනේ."*

දැන් බැලුවහම කාදිනල් උන්නාන්සේගෙයි මහජන ආරක්ෂක අමාත්‍යවරයාගෙයි ප්‍රකාශ දෙක අතිශයින්ම පරස්පරයි. රජය ඇතුළු වගකිවයුතු ආයතන මේ වෙනකං පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නැති බවත්, කර ඇති පරීක්ෂණ යට ගහන බවත් කාදිනල් උන්නාන්සේ චෝදනා කරද්දි, මහජන ආරක්ෂක අමාත්‍යවරයා කියන්නේ මේ වන විට පාස්කු ප්‍රහාරය සම්බන්ධ රහස් පොලිස් පරීක්ෂණ 99%ක් අවසන් බවත්, ඒ සම්බන්ධ සම්පූර්ණ වාර්තාව කතෝලික සභාවට ඉදිරිපත් කර ඇති බවත්ය.

මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් මේ වන විට පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ වාර්තාවක් කතෝලික සභාවට ඉදිරිපත් කර තිබියදී එය ගැන වචනයක් හෝ නොකියා සිටියේ එම වාර්තාව ඔහුගේ ඇස නොගැටීම නිසා නම් එයත් අතිශය බරපතල තත්වයකි. මීට පෙරත් අවස්ථා ගණනාවකදී කාදිනල් උන්නානසේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පොලිස් විමර්ශන අංශ කිසිඳු පරීක්ෂණයක් කර නොමැති බව ප්‍රකාශ කර තිබිණි.

අමාත්‍යවරයාගේ ඉහත ප්‍රකාශය අනුව, කතෝලික ප්‍රජාවේ ප්‍රධානියකු ලෙස ගරු කටයුතු කාදිනල් තනතුරේ කටයුතු කරනු ලබන මැල්කම් රංජිත් හිමි පාස්කු ප්‍රහාරයේ විමර්ශන සම්බන්ධයෙන් ව්‍යාකූලතාවයක් ගොඩනැගිම වෙනුවෙන් සිතාමතා ජනතාව නොමඟ යැවීමක යෙදෙනවා කියන සැකය ඇති වීම වැලැක්විය නොහැක. එසේම මෙම ප්‍රහාරයේ සැකකරුවන්ට එරෙහිව දැනට අධිකරණය හමුවේ ගොනු කර තිබෙන චෝදනා සම්බන්ධයෙනුත් විභාග කිරීමත් මේ වන විටත් සිදුවෙමින් තිබෙන අතර කාදිනල් උන්නාන්සේ කතා කරන්නේ ඒ කිසිවක් නොදන්නා ගානට වීමත් මේ සැකය තිව්‍ර කරයි. එමෙන්ම එවක ජාතික බුද්ධි අංශ ප්‍රධානී ලෙස කටයුතු කළ නියොජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධනට එරෙහිව ජාතික පොලිස් කොමිසම විසින් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, මේ වන විටත් එම පරීක්ෂණය සිදුවෙමින් පවතී. එයත් කාදිනල් උන්නාන්සේ නොදන්නවා විය නොහැක.

මේ අතර තවත් වැදගත් සිදුවීමක් වන්නේ හිටපු නීතිපතිවරයාගේ ප්‍රකාශය හා බැඳුණු තත්වයයි. හිටපු නීතිපති දප්පුල ද ලිවේරා සිය ධූරයෙන් විශ්‍රාම යෑමට ආසන්න මොහොතකදී පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කරනු ලැබිණි. රාජ්‍ය බුද්ධි සේවයට පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු කරන ආකාරය, වේලාව, දිනය සහ අනෙකුත් තොරතුරු ලැබීම හරහා දැවැන්ත කුමන්ත්‍රණයක් මෙම ප්‍රහාරය පිටුපස තිබූ බව පෙනී යන්නේ යැයිද, මෙම දැවැන්ත කුමන්ත්‍රණයට සම්බන්ධ සියලු දෙනා සාක්ෂි හරහා අනාවරණය කළ යුතු බවද එහිදී හිටපු නීතිපතිවරයා විසින් ප්‍රකාශ කර තිබිණි. මෙහි ආන්දෝලනාත්මකම ප්‍රකාශය වූයේ "**කුමන්ත්‍රණය සිදු කළ පුද්ගලයින් වෙනම තලයක සිටින බවත්, සහරාන් හෂීම් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට තීරණය කළද, ඔහුත් මෙම කුමන්ත්‍රණකාරී පුද්ගලයින්ගෙන් එක් අයෙක් පමණයි.**" යනුවෙන් සිදු කළ ප්‍රකාශයයි.

මේ සම්බන්ධයෙන් විර්ශනය කිරීම සඳහා පසුගිය අප්‍රේල් 19 වන දින හිටපු නීතිපති දප්පුල ද ලිවේරා මහතාව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත කැඳවූ නමුත් එදින ඔහු ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත පැමිණීම මඟ හැර ඒ වෙනුවට නීතිඥයෙක් ඉදිරිපත් කර තිබිණි. මෙම නීතිඥවරයා පවසා සිටියේ හිටපු නීතිපතිවරයා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවීම සම්බන්ධයෙන් පිටු 7ක නෛතික විරෝධතාවයක් ගොනු කළ බවයි. කෙසේ වෙතත් පසුව ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් දන්වා සිටියේ අප්‍රේල් 24වන දින ප්‍රකාශයක් නොකළහොත් ඒ සම්බන්ධයෙන් දප්පුල ද ලිවේරා මහතාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

අනතුරුව දප්පුල ද ලිවේරා මහතා විසින් සිදු කළේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත යෑම වෙනුවට අභියාචනාධිකරණය හමුවට යාමයි. අභියාචනාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කරමින් හිටපු නීතිපතිවරයා විසින් තමන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවීමට එරෙහිව රිට් පෙත්සමක් ගොනු කළ අතර, අදාල පෙත්සම විභාගයට ගත් විනිසුරු මඩුල්ල විසින් හිටපු නීතිපති දප්පුල ද ලිවේරා මහතාගෙන් ප්‍රශ්න කිරීම, ප්‍රකාශ සටහන් කර ගැනීම සහ අත්අඩංගුවට ගැනීම වළක්වාලමින් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත අතුරු තහනම් නියෝගයක් නිකුත් කරනු ලැබුවා.

හිටපු නීතිපතිවරයාගේ මෙම ප්‍රකාශය උපුටා ගනිමින් කාදිනල් හිමිපාණන්ද අවස්ථා ගණනාවකදී මාධ්‍ය වෙත විවිධ ප්‍රකාශ කර තිබුණු අතර, මේ සම්බන්ධයෙන් ද මහජන ආරක්ෂක අමාත්‍යවරයා පසුගිය දා පැහැදිලි කිරීමක් කර තිබිණි.

*"... කාදිනල්තුමානේ ඉස්සෙල්ලාම මහමොලකරු ගැන කිවුවේ. ඒ හා සමාන දෙයක් කිවුවා අන්තිමේට විශ්‍රාම යන්න ඉස්සෙලා දවසේද කොහෙද හිටපු නීතිපතිතුමා. දැන් ඒක ගැන අහන්න එයාට එන්න කිවුවහම එයත් හැංගුණා. ඊළඟට එයා උසාවි ගියා. ගිහිල්ලා ස්ටේ ඕඩර් එකක් ගත්තා.*

*එහෙම තියෙනව නං එයාට ඇවිල්ල කියන්න පුළුවන්නේ නීතිපති හැටියට මං මේ ඔක්කොම ස්ටඩි කරන කොට මට තේරුනා මෙහෙම එකක් කියලා. එහෙම මුකුත් නෑ. නීතිපතිතුමා හැංගුණ දවසෙ ඉඳන් කදිනල්තුමාගෙ මහමොලකරු කතාවත් නැවතිලා.*

*ඉතින් මම කියන්නෙ එහෙම එක එක්කෙනා කියන ඒව නෙමෙයි. හරි විමර්ශනයක් කරන්න ඕනේ. ඒක හින්ද තමයි මම විවෘතව ආරාධනා කරල තියෙන්නෙ කතෝලික සභාවට මේ පොලිසිය කරපු දේ බලන්න. මුල ඉඳන් අග වෙනකං කරල තියෙන දේ බලන්න. එතකොට උන්වහන්සේලා ළඟ මොනව හරි තියෙනව නං අපි දන්නෙ නැති දෙයක්, අපිට කියන්න. එතකොට ඒකත් අපි ඉන්වෙස්ටිගේට් කරන්නම්."*

මේ අවස්ථාවේදීද මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් අවධාරණය කර සිටියේ කාදිනල් හිමිපාණන් ඇතුළු කතෝලික සභාව විසින් පාස්කු ප්‍රහාරයට අදාල විමර්ශන නිවැරදි කිරීම වෙනුවෙන් ඔවුන්ගෙන් ආයාචනා කළ සහය ලබා නොදුන් බව නොවේද?

තත්වය එසේ නම් කාදිනල් හිමිපාණන්ගේ මෙම දෙබිඩි පිළිවෙත මහත් කුතුහලයක් දනවන සුළු තත්වයක් බව කීම වැරදි නොවේ. මහජන සභාවලදී හා කතෝලික ප්‍රජාවන් ඒකරාශී වන අවස්ථාවන්හිදී කාදිනල් හිමිපාණන් විසින් දිගින් දිගටම සිදු කරමින් සිටින්නේ රජය හා අදාල වගකිවයුතු ආයතන විසින් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිදු සාධාරණ පරීක්ෂණයක් කර නොමැති බවට රට නොමඟ යවන ප්‍රකාශ සිදු කිරීමය. එසේ නමුත් කතෝලික සභාව හා කාදිනල් උන්නාන්සේ විසින් මේ විමර්ශන සාර්ථක කරගැනීම වෙනුවෙන් කිසිඳු සහයක් නොදක්වන බවත් මේ අනුව පැහැදිලි වන කරුණකි. රජය විසින් ලබා දී ඇති අවස්ථාවන් ද දිගින් දිගටම පැහැර හරිමින් ඇත.

එපමණක් නොව කාදිනල් හිමිපාණන් විසින් දිගින් දිගටම ප්‍රකාශ කළ "**පාස්කු ප්‍රහාරයේ මහ මොලකරු**" පිළිබඳ කතාවට අටුවා ටීකා සැපයූ හිටපු නීතිපතිවරයා සැඟවී ගිය මොහොතේ සිට එම ප්‍රකාශ නොකිරීම පරිස්සම් වීම සහ හිටපු නීතිපතිවරයා සිය වගකීම පැහැර හරමින් නීතියේ සිදුරු අතරින් රිංගා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මඟහැර යාම සම්බන්ධයෙන් කාදිනල් උන්නාන්සේ කිසිදු ප්‍රකාශයක් නොකිරීම ද අතිශය කුහුළ දනවන කරුණකි.

තත්වය මෙසේ නම් කාදිනල් හිමිපාණන්ගේ මෙම දෙබිඩි පිළිවෙත සම්බන්ධයෙන් කතෝලික ප්‍රජාව, පාස්කු ප්‍රහාරයේ වින්දිතයින් පමණක් නොව මෙරට නීතිය, සාමය හා සංහිදියාව අගය කරන සියල්ලන්ගේ සැකයට තුඩුදෙන තත්වයක් වීම මඟහැරිය නොහැකි සත්‍යයක් වී ඇත.

කාදිනල් හිමිපාණන්ට මෙන්ම කතෝලික සභාවට පාස්කු ප්‍රහාරයේ සැබෑ වරදකරුවන් හෙළිකිරීමට අවංක අදහසක් ඇත්නම් කළ යුතුව ඇත්තේ මහජන ආරක්ෂක අමාත්‍යවරයාගේ යෝජනාව ඉටු කර දීමය. තමන් වෙත ලබා දී ඇති පරීක්ෂණ වාර්තාව ගැඹුරින් අධ්‍යයනය කොට වගකිවයුතු අදාල ආයතන වෙත එහි ඇති අඩුපාඩු පෙන්වා දීමය. පරීක්ෂණ වාර්තාවේ නැති, නමුත් තමන් සතුව ඇති තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනය කරන ලෙස ඉල්ලා සිටීමය. මඟහැර ඇති හෝ මඟහැරී ඇති කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලා සිටීමය.

එසේ නොකොට හන්දියක් හන්දියක් ගානේ මයික් පළමින් බෑගිරි ගසන විට කාදිනල් උන්නාන්සේට ලැබෙන යමක් තිබෙනවා විය හැකි නමුත් පාස්කු වින්දිතයින්ට ලැබෙන සාධාරණයක් නැත. කතෝලික සභාවට හෝ කිතුනු ජනතාවට ලැබෙන බක්කක් නැත. නීතිය, සාමය හා සංහිදියාව අපේක්ෂා කරන ජනතාවට ලැබෙන පිළිතුරක් නැත. කාදිනල් උන්නාන්සේගේ මෙතෙක් හැසිරීම අනුව මෙම පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු කාදිනල් උන්නාන්සේම විය හැකි බවට කිසිවකුට හෝ කල්පනා වුවොත් එයත් වැරදි නැත. මන්ද ඇත්ත තත්වයන් වසං කරමින් බොරු බේගල් ඇද දමමින් කාදිනල් උන්නාන්සේගේ නටන නාඩගම ඒ තරමටට සැක සහිතය.

කෙසේ වෙතත් කාදිනල් උන්නාන්සේට හෝ කතෝලික සභාවට මෙලෙස එල්ල විය හැකිව තිබෙන චෝදනාවෙන් ගැලවිය හැකි වන්නේ ඔවුන් ද කාගේ හෝ ඉත්තෙකු අතකොළුවකු නොවී, අනුන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර අනුව කටයුතු කිරීමෙන් වැළකී, අවංකව සද් චේතනාවෙන්, දෙවියන් වහන්සේගේ නාමයෙන් මේ සම්බන්ධයෙන් උන්නදුවක් මැදිහත්වීමක් වුවහොත් පමණක් වනු ඇති බව අවසානයේ සටහන් කර තබමු.

රිද්ම අනුරාධ ගමගේ

Mr. President

# මිනිස්සුන්ට ඕනේ කාලා ඇඳලා සාමාන්‍ය විදියට ජීවත්වෙන්න

නැගෙනහිර පළාතේ සංචාරය නිමකළ ජනපති රනිල් කොළඹ පැමිණ ඉරිදා දිනය වෙන් කර තිබුණේ අමාත්‍ය මණ්ඩල සංදේශ මොනවාදැයි අධ්‍යයනය කිරීමටය. පෞද්ගලික හමුවීම් කිහිපයක් යෙදී තිබුණ ද වෙනත් රාජකාරි කිසිවක් එදින යොදාගෙන නොතිබුණේ මේ කටයුත්ත වෙනුවෙනි.

සඳුදා පෙරවරුවේ ඇමති මණ්ඩල හමුව පැවැති අතර එහිදී අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම ගැන සාකච්ඡා කළේය. මෙම සතියේ සිට එය ගෙවන බව ජනපති දැනුම් දුන්නේ ඇමතිවරුන්ටය. ජනාධිපති විදේශීය සබඳතා ශක්තිමත් කර ගනිමින් දේශීය ආර්ථිකය නගා සිටුවීමට කටයුතු කරන බව මෙහිදි කියැවිනි.

කැබිනට් හමුව අවසන් වී ජනපති රනිල් පිටතට එද්දී ජනපති පාර්ලිමේන්තු උපදේශක මහාචාර්ය ආශු මාරසිංහ සමඟ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු රැඳී සිටියේ ජනපති හා අගමැති දෙදෙනාම මුණ ගැසීමටය. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් වන ප්‍රේමනාත් සී. දොලවත්ත, මධුර විතානගේ හා ජගත් සමරවික්‍රම ඒ අතර වූහ.

## කාලේ කන විපක්ෂය

"සර් මේ කට්ටිය ඇවිල්ලා ඉන්නේ පැමිණිල්ලක් කරන්න." මහාචාර්ය ආශු කීවේ ජනපති හා අගමැති දෙස බලමිනි.

"විපක්ෂ නායකතුමයි එයාගේ කට්ටියයි උදේට තියෙන මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න පැය විනාශ කරනවා." දොලවත්ත මන්ත්‍රීවරයා කීය.

"විපක්ෂය කරන වැඩේ හින්දා අපිට විවාදයේ කතා කරන්න වෙලාවක් ලැබෙන්නේ නෑ. ඒ නිසා මෙතන වැඩිම අසාධාරණයක් වෙන්නේ ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරුන්ට. අපිට කතාවට විනාඩි 15ක් වෙන් වුනත් විපක්ෂ නායකගේ මේ කෝළම නිසා අන්තිමට අපිට විවාදයේදි ලැබෙන්නේ විනාඩි 4ක විතර කාලයක්. මේක හරිම අසාධාරණයක්." මන්ත්‍රී ජගත් සමරවික්‍රම ද කීවේ එවැන්නකි.

"පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන්නට දිනකට ලක්ෂ 40ට වඩා වියදම් වෙනවා. විපක්ෂ නායකතුමා අවශ්‍ය දේයි අනවශ්‍ය දේයි දෙකම කතා කරන හින්දා මහජන මුදල් නාස්තියක් වෙන්නේ." මධුර විතානගේ ද කතාවට එක්වූවේ එලෙසිනි.

"මේ කතාව අපි අනන්තවත් පක්ෂ නායක රැස්වීම්වලදී කතා වෙනවා. එතනදි කාලය කළමනාකරණය කරගන්න එකඟ වෙලා සභාවට ආවට පස්සේ ඒක වෙනස් කරනවා. වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට පැයක් වෙන් කරලා තිබුණත් ඒක පැය දෙක තුනක් මේ අය ඇදගෙන යනවා." එතනට පැමිණි ආණ්ඩු පක්ෂ සංවිධායක ප්‍රසන්න රණතුංග ද මන්ත්‍රීවරුන්ගේ කතාව අනුමත කළේය.

"අපි මේ ගැන කතානායකතුමා එක්ක කතා කරන්නම්" ජනපති රනිල් කීවේ අගමැති දිනේෂ් දෙස බලමිනි.

ජනපති එක්සත් ජාතික පක්ෂ සංවත්සර කමිටු නිලධාරීන් මුණ ගැසුණේ ඉන් අනතුරුවය. වැඩකටයුතු ඉදිරියට ගෙන යාම ගැන සාකච්ඡා කොට සවස කළමනාකරණ කමිටුවට තොරතුරු දැනුම්දෙන ලෙස දන්වමින් ජනපති පිටත්ව ගියේ තවත් රාජකාරියක් වෙනුවෙනි.

## එජාපය සංවත්සරයට සූදානම්

මහලේකම් රංගේ බණ්ඩාගේ කැඳවීමෙන් පිරිස සාකච්ඡාවට යොමු වූ අතර නියෝජ්‍ය නායක රුවන්, උපනායක අකිල, සභාපති වජිර හා ජාතික සංවිධායක සාගල ඇතුළු පිරිස සාකච්ඡාවට එක් වූවෝය. සංවත්සර සම්මේලනයේ වගකීම් පිරිසට පැවරුවේ මහලේකම් විසිනි.

මෙහිදී මතුව ආ පැනය වූවේ සම්මේලනයේ වර්ෂයේ වැරැද්දක් ඇති බව කියමිනි. මහලේකම් රංගේ යැවූ ලිපිවල 56 වැනි සම්මේලනය ලෙස සටහන්ව තිබීම ගැන හිටපු මුදල් ඇමති රවි කරුණානායක ප්‍රශ්න කළේය. අවුරුදු හැත්ත ගණනක් සම්මේලන පවත්වපු පක්ෂයක මෙලෙස 56 කියා පළ කිරීම තුළ පාක්ෂිකයා අවුල්වන බව ඔහු පෙන්වා දුන්නේය.

මහලේකම් රංගේගේ ප්‍රතිචාරය වූවේ සම්මේලනය හා සංවත්සරය පටලවාගෙන



ඇති බවය. පක්ෂය විසින් අනාදිමත් කාලයක් තිස්සේ සංවත්සර හා සම්මේලන පවත්වා ඇති බවත් විශේෂ සම්මේලන පවා පවත්වා තිබෙන බවත් ඔහු කීවේය.

මෙවර පවත්වන්නේ පක්ෂයේ 77 වැනි සංවත්සරය බව කී රංගේ එය පවත්වනුයේ පක්ෂය පිහිටුවූ දිනය සිහි කිරීමට බව කියා සිටියේය. පක්ෂ සම්මේලන පැවැත්වූවේ පක්ෂ ව්‍යවස්ථාව වෙනස් කිරීම් ආදී විශේෂ අවස්ථාවලදී බව ඔහු පෙන්වා දුන්නේය. සංවත්සරය සමඟ මෙවර පවත්වන සම්මේලනය පක්ෂයේ 56 වැනි සම්මේලනය බව මහලේකම් රංගේ කියා සිටියේය.

අවසානයේ සිරිකොත පාලන අංශයේ පැරණිම සාමාජිකාව වූ ඉවෝන්ට කතා කොට සම්මේලන පොත ගෙන්වා ප්‍රශ්නය නිරාකරණය කර ගත්තේය. නමුත් පිරිස කියන්නට වූවේ 77 නමින් යා යුතු බවටය. එහෙත් මහලේකම් කීවේ ආරාධනා පත්‍ර හා පෝස්ටර් යන දෙකම 56 හා 77 දෙකම සටහන් වන බැවින් මෙය වෙනස් කරන්නට ගියහොත් අමතර මුදලක් වැය කිරීමට සිදුවනු ඇති බවය.

කෙසේ නමුත් නැවත ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීමට තීන්දු කෙරුණු අතර නීති අංශයේ දයා පැල්පොල හා රොනල්ඩ් පෙරේරා කියා සිටියේ මහලේකම් රංගේ ආවාට ගියාට දෙයක් කියන්නේ නැති බවය. 56 ඉවත් කොට ආරාධනා පත්‍ර සහ පෝස්ටර් මුද්‍රණය කිරීමට තීන්දු කෙරුණු අතර නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන එම ගැටළුව විසඳා දීමට ඉදිරිපත් වූවේය.

ඉන් පසුව සංවත්සර සම්මේලනය පැවැත්වෙන ස්ථානය පරික්ෂා කිරීමට මහලේකම් රංගේ, ශමල් සෙනරත් හා ලසන්ත ගුණවර්ධන ගියේ ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරීන් සමඟය. රැස්වීම පැවැත්වෙන ආකාරය නිරීක්ෂණය කළ පිරිස පසුව යළිත් සවස ජනාධිපති කාර්යාලය වෙත පැමිණියේ ජනපති සමඟ පැවැත්වෙන පක්ෂයේ කළමනාකරණ කමිටුවට සහභාගී වීමටය.

කළමනාකරණ කමිටුවේදී ද සංවත්සර සම්මේලනයේ ප්‍රගතිය ගැන ජනපති විමසා සිටි අතර මහලේකම් රංගේ ඊට අදාළව කරුණු පැහැදිලි කළේය. 20,000 වැඩි සංඛ්‍යාවක් ආරාධිතයන් ලෙස පැමිණෙන බව කී රංගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පක්ෂ නායකයන්ට, තානාපතිවරුන්ට හා ආණ්ඩුකාරවරුන්ට ආරාධනා කරන්න දැයි ජනපතිගෙන් විමසා සිටියේය.

එය අවශ්‍ය නොවන බව කී ජනපති රනිල් එක් ආණ්ඩුකාරවරයෙකුට පමණක් සංවත්සර සම්මේලනයට සහභාගී විය හැකි යැයි කියද්දී සැමට සිනහව නතරකර ගැනීමට නොහැකි වූහ. සම්මේලනය වෙනුවෙන් කළ යුතු දෑ නියෝජ්‍ය නායක රුවන්, සභාපති වජිර හා ජාතික සංවිධායක සාගල රත්නායක විසින් භාර ගන්නා ලදි.

## ජනවාරියේ සුබ පල

සංවත්සර සම්මේලනයේ කටයුතු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජනපති රනිල් රටේ තත්ත්වය ගැන පිරිසට කරුණු පැහැදිලි කළේය. සංචාරක ව්‍යාපාරයේ දියුණුව ජනවාරි වන විට රටේ ආර්ථිකයට සුබ ප්‍රතිඵල ගෙන දෙන බව ජනපති පෙන්වා දුන්නේය. එසේම ජනපතිගේ ත්‍රිකුණාමලයේ හා අරුගම්බේ ගමන ගැන ද ඔහු තොරතුරු හෙළි කළේය.

එහි සංචාරක ව්‍යාපාරය නගා සිටුවීම ගැන ද ජනපති මෙහිදි කරුණු පෙන්වා දුන්නේය. එසේම අස්වැසුම ප්‍රතිලාභ මෙම සතියේ සිට ගෙවන බවද ඔහු පැවසුවේය. එහිදි හිටපු මුදල් ඇමති රවි ඇතුළු පිරිසක් යෝජනා කළේ හැමදේම නිකම්ම ලබාදීමේ ආදීනව ගැනය. අස්වැසුම ගන්නා හැම කෙනාටම කුමක්හෝ රාජකාරියක් පැවරිය යුතු බව ඔවුන් කියා සිටියෝය.

තමන්ට ලැබෙන මුදලට එවිට ඔවුන් වගකියන බව ද මෙහිදි කියැවින. ඊට ප්‍රතිචාර දැක්වූවේ මහලේකම් රංගේය. "සර් ඊළග ජනවරම එනකම් මුකුත් කරන්න එපා." යැයි කියද්දී "ඔව් ඔව් මේවා අපි සද්භාවයෙන් කියන්න ගිහින් කට වරද්දගෙන තියෙන්නේ." අනෙක් පිරිස ද එක හඬින් කියන්නට වූහ.

ජනපති මේ සියල්ල අසා සිටියා මිස කිසිවක් කීවේ නැත. මහලේකම් රංගේ ද මෙම සාකච්ඡාවට ප්‍රථම ඔහුගේ උතුරු නැගෙනහිර සංචාරයේ ප්‍රගතිය ජනපතිට පිළිගැන්වූවේය.

ජනපති අඟහරුවාදා සිය කාර්යාලයට පැමිණෙන විට මැති ඇමතිවරු පිරිසක් ද එහි පැමිණ සිටියෝය. ඔවුන් ඉදිරිපත් කළ පැනය වූවේ එදින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට භික්ෂූන් වහන්සේලා පිරිසක් බලෙන් කඩාපාත්වීම ගැනය. එය නරක පූර්වාදර්ශයක් බව පිරිස කියන්නට වූහ. මෙය පූර්වාදර්ශයක් වුවහොත් කිසිදු දිස්ත්‍රික් සංවර්ධන කමිටුවක් පැවැත්විය නොහැකි වනු ඇතැයි මන්ත්‍රී වජිර අබේවර්ධන කීවේය.

කුරුන්දි විහාර ගැටළුව ගැන මෙන්ම ත්‍රිකුණාමලය ගැටළුව ගැන ද තමන් එදින සවස මල්වතු අස්ගිරි මහනාහිමිවරුන් බැහැදැක සාකච්ඡා කරන්නේ යැයි ජනපති පිරිසට කීවේය. ජනපති ඉන් පසුව ගියේ තිරසර සංවර්ධන දිසානතිය පිළිබඳ සාකච්ඡාවට එක්වීමටය. අගමැති දිනේෂ් ද ඊට එක්ව සිටි අතර අන් රටවලින් උපකාර ලැබෙන තෙක් බලා නොසිට ජාතියක් ලෙස අපම තනියෙන් නැගී සිටිය යුතු බව ජනපති එහිදි කීවේය.

## මහනායක හිමිවරුන්ගේ උපදෙස

ජනපති එදින සවස මහනුවරට ගොස් දළදා සමිඳු වැදපුදා ගැනීමෙන් පසු මල්වතු අස්ගිරි මහනාහිමිවරුන් හා අනුනාහිමිවරුන් බැහැදුටුවේය. ඔහු සමඟ මේ ගමනට එක්සත් ජාතික පක්ෂ හිටපු සභාපති මලික් සමරවික්‍රම ද එක්ව සිටියේය.

අස්ගිරි පාර්ශවයේ අනුනායක වෙඩරුවේ උපාලි සහ අස්ගිරි පාර්ශවයේ අනුනායක ආණමඩුවේ ධම්මදස්සි නාහිමිවරුන් ද ජනපති බැහැ දුටුවේය. මෙහිදි ආණමඩුවේ ධම්මදස්සි අනු නාහිමිය-න් ජනපතිගේ ක්‍රියාකලාපය අගය කළ අතර ඔහුට රට දියුණු කරන්න සැවොම සහාය දිය යුතු බව කියා සිටියහ.

"ජනාධිපතිතුමා අපි බණට ගියාම රටේ ප්‍රශ්න ගැන ජනතාව අහනවා. ඉතින් මම හිතුවා මේ වෙලාවේ ඒ ප්‍රශ්න ටික ඔබතුමාගෙන් අහන්න. එතකොට අපිට ජනතාව අහන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න පුළුවන්." අනුනාහිමියෝ ජනපතිට කියද්දී "ඕන දෙයක් අහන්න නායක හාමුදුරුවනේ යැයි." ජනපති පිළිතුරු දුන්නේය.

එහිදි අනුනාහිමියෝ අයි.එම්.එෆ් ගැටළුව මෙන්ම 13 වෙනි සංශෝධනයේ ඉඩම් ගැටළුව ගැන ද විමසා සිටියහ. ඊට ප්‍රතිචාර දක්වමින් ජනපති රනිල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කර දුන්නේය. එසේම 13 වෙනි සංශෝධනය ගැන සියලු කටයුතු කරනුයේ පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව බව කී ජනපති රනිල්, ඉඩම් පිළිබඳ සොයා බැලීමට ජාතික ඉඩම් කොමිසමක් පිහිටුවා එහි බලය ජාතික මට්ටමෙන් පවත්වාගෙන යන බවද කීවේය.

"මිනිස්සුන්ට ඕනේ කාලා ඇඳලා සාමාන්‍ය විදියට ජීවත් වෙන්න. නමුත් කණ්ඩායම් කිහිපයක් ඒක වෙනස් කරන්න හදනවා. පිටින් ගිහිල්ලා ප්‍රශ්න හදනවා. කුරුන්දි විහාරයේ ප්‍රශ්නයත් ඒ වගේ මට පේන්නේ. මේවට ඉඩ දෙන්න එපා." අනුනාහිමියෝ කීහ.

තමන් ඊට ඉඩ නොදෙන බව කී ජනපති එම පළාත් වල ප්‍රධාන භික්ෂූන් වහන්සේලා ඇතුළු පූජකවරුන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කොට පූජනීය ස්ථානවල ගැටළු විසදන බව කීවේය. ජනපති රනිල් මෙහිදි මල්වතු පාර්ශවයේ අනුනායක දිබුල්කුඹුරේ විමලධම්ම නාහිමියන්ද බැහැදැක සාකච්ඡා කළේය.

## ඇමරිකානු දූතයන් දුටු රටේ අසිරිය

ජනපති රනිල් ඇමරිකානු සෙනෙට් සභික ක්‍රිස් වැන් හොලන් මුණ ගැසුණේ මහනුවර ජනාධිපති මන්දිරයේදී ය. ඊට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක ද එක්ව සිටියේය. එහි ආලින්දයේ ස්වල්ප වේලාවක් කතා බස් කරමින් සිටි ජනපති සෙනෙට් සභික වැන් හෝලන්ව මන්දිරය පිටුපසට කැඳවාගෙන ගියේය.

මන්දිරය පිටුපස ඇති උඩවත්ත කැලේ පෙන්වමින් මහනුවර ඉතිහාසය ගැන දීර්ඝ විස්තරයක් කර සිටියේ සෙනෙට් සභිකව පුදුම කරවමිනි. පැය භාගයක පමණ සාකච්ඡාවකින් පසු ජනපති දළදා පෙරහැර නැරඹීට ක්වින්ස් හෝටලය වෙත ගියේ සෙනට් සභික වැන් හෝලන් හා මෙරට ඇමරිකානු තානාපතිනි ජූලි චැන්ග් ඇතුළු පිරිස ද එක් කරගනිමිනි.

ජනපති ක්වීන්ස් හෝටලය වෙත එනවිට ජනතාවගෙන් හිමිවූයේ ඉතා ඉහළ පිළිගැනීමකි. පසුදින පෙරවරුවේ ජනපති මහනුවර නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය වෙත ගියේ පාසල් සිසුන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම වෙනුවෙන් පාසල් 100ක පිහිටුවීමට යන ප්‍රාග්ධන වෙළෙඳපොල සමාජයේ පළමු සමාජය පිහිටුවීමටය.

ඉතා දක්ෂ ලෙස කටයුතු කරන පාසල් සමාජවලට ත්‍යාග පිරිනමන බව කී ජනපති රනිල් ඉහළම දස්කම් දක්වන සිසුන් සහ ගුරුවරුන් සිංගප්පූරු ප්‍රග්ධන වෙළෙඳ පොල නැරඹීමට යොමු කරන බව ද කීවේය. ජනාධිපති තරුණ කටයුතු අධ්‍යක්ෂ රන්දුල අබේවීර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

සිසුදරු දැරියන් සමඟ සුහද කතාබහක නිරතවූ ජනපති රනිල් ඉන් පසු පැමිණියේ ඇසල පෙරහැර මංගල්‍යයේ අවසන් අදියර වන පෙරහැරේ දස්කම් පෑ ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය කිරීමේ සාම්ප්‍රදායික උත්සවයට එක්වීමටය.

Mediaman

# ආර්ථිකයේ නව පදනම



1977 ආර්ථිකය විවෘත කිරීම යනු මෙරට සිදු වූ ධනේශ්වර විප්ලවය යැයි කෙනෙක් තර්ක කරනවා නම් එහි වරදක් නැත. පැවැති සංවෘත ආර්ථිකය තුළ පැවැති ආර්ථික පීඩනයට කොටුවීම බිඳලමින් රට ලෝකයට විවෘත වීමත් සමඟ ශ්‍රී ලාංකිකයින්ට ලෝකය දකින්නට අවස්ථාව ලැබුණි. එහි ප්‍රථිපලයන් ලෙස හැකියාවට හා දක්ෂතාවයට අවස්ථාව ලැබීමත් සමඟ සහනාධාර මත ජීවත්වීම වෙනුවට ඉපයූ අදායම් මත දියුණුවීමට හැකිවිය. අධ්‍යාපන අවස්ථා පුළුල් විය. දේශීයව මෙන්ම විදේශීයව හෙඳ අධ්‍යාපනයක් ලැබීමට දරුවන්ට අද හැකි වී ඇත්තේ රට විවෘත වූ නිසාය.

මා මේ ශිර්ෂය ලෙස උපුටනය කළේ, 2023 සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ අයවැය කථාවේ 3 වන පරිච්ඡේදයේ ශිර්ෂයයි. එම පරිච්ඡේදය ආරම්භ වන්නේ මෙසේයි. **"1977 වසරේ නිර්මාණය කෙරුණු ආර්ථික පදනම දැන් වලංගු නැහැ. එය වර්තමානයට ගැලපෙන්නේ නැහැ. එය දැන් කඩා වැටිලා. අපේ රටේ ක්‍රියාත්මක වූ සංවෘත ආර්ථිකය සේම 1977 නිර්මාණය කළ ආර්ථිකයත් අසාර්ථක වී හමාරයි. ඒ නිසා අප වර්තමානය ගැන අලුතින් සිතිය යුතුයි. සුගතපාල ද සිල්වා 'මරාසද්' නාට්‍යයේ දක්වන විදියට 'කොට්ට උරයක් මෙන් කනපිට හරවා අලුත් ඇහැකින් ලෝකය දෙස බැලිය යුතුයි."** ජනාධිපතිවරයා මෙයින් අවධානය යොමු කරන්නේ පවත්නා අර්බුදයෙන් ගොඩ ඒමට නම්, විකල්ප ආර්ථික ප්‍රතිපත්තීන් දෙසට අවධානය යොමු කළ යුතු බවකි.

නව ආර්ථික ක්‍රමය තුළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට අරමුණු කරන ආකාරය, එම පරිච්ඡේදයේම තවත් කොටසකින් දක්වන්නේ මෙසේය. **"මෑත ඉතිහාසයේ අප මුහුණ දුන් ආර්ථික අර්බුදය හේතුවෙන් මුළු රටම දුෂ්කරතාවන් රැසකට මුහුණ දුන්නා. එදා වේල සරිකර ගන්න බැරි වුණා. රැකියා අනතුරේ වැටුණා. ආදායම් අහිමි වුණා. ව්‍යාපාර කඩා වැටුණා. තවමත් ඒ සියළු දුෂ්කරතාවන්ගෙන් සම්පූර්ණයෙන් මිදෙන්නට පුළුවන් වෙලා නෑ. ජනතාව මෙවැනි දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේ රට යළි ගොඩ නැංවීමේ බලාපොරොත්තු හදවතේ රඳවාගෙනයි. අපි සියළු දෙනාම ඒ කැපවීම කළේ, තවමත් කැපවීම් කරන්නේ රට යළි නංවාලීමේ අරමුණු ඇතිවයි. රට වෙනුවෙන් කැපවීම් කරන සියලු දෙනාට, අප ගොඩනංවන නව ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යා යුතුයි. සැමට සමාන අවස්ථා නිර්මාණය විය යුතුයි. එය සමාජයේ කුඩා කණ්ඩායමක් පමණක් පොහොසතුන් කරන ආර්ථික ක්‍රමයක් නොව, සමස්ත සමාජයම ඉහළට ඔසවා තබන ආර්ථික ක්‍රමයක්."**

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා කරන උක්ත ප්‍රකාශ දෙක සවිඥානිකව නිරීක්ෂණය කරන්නේ නම් එයින් පැහැදිලි වන්නේ, විවෘත ආර්ථිකය මෙරටට හඳුන්වා දෙමින් හා ඉන් පසුව ක්‍රියාත්මක කළ ලිබරල් ආර්ථික ප්‍රතිපත්තීන් හේතුවෙන් දශක 4කට වැඩි කාලයක් පුරා අප කවර ජයග්‍රහණ අත්කරගෙන තිබුණද, එයින් ජන සමාජයේ සියළු දෙනාගේ සමාජ - ආර්ථික ජයග්‍රහණය කර ගැනීමට නොහැකිවී ඇති බවයි.

කෙසේ වෙතත් එම ආර්ථික වැඩපිළිවෙල සමස්ත සමාජයට ඇති කළ යහපත් මෙන්ම අයහපත් ගුණාංග දැන් අප සියලු දෙනාගේ ජන ජීවිතයට ඇතුලත් වී හමාරය. ඒ අනුව එහි සාර්ථක භාවයන් මෙන්ම අසාර්ථකභාවයන්ද අප පොදුවේ භුක්ති විඳින්නෙමු.

1977 ආර්ථිකය විවෘත කිරීම යනු මෙරට සිදු වූ ධනේශ්වර විප්ලවය යැයි කෙනෙක් තර්ක කරනවා නම් එහි වරදක් නැත. පැවැති සංවෘත ආර්ථිකය තුළ පැවැති ආර්ථික පීඩනයට කොටුවීම බිඳලමින් රට ලෝකයට විවෘත වීමත් සමඟ ශ්‍රී ලාංකිකයින්ට ලෝකය දකින්නට අවස්ථාව ලැබුණි. එහි ප්‍රථිපලයන් ලෙස හැකියාවට හා දක්ෂතාවයට අවස්ථාව ලැබීමත් සමඟ සහනාධාර මත ජීවත්වීම වෙනුවට ඉපයූ අදායම් මත දියුණුවීමට හැකිවිය. අධ්‍යාපන අවස්ථා පුළුල් විය. දේශීයව මෙන්ම විදේශීයව හෙඳ අධ්‍යාපනයක් ලැබීමට දරුවන්ට අද හැකි වී ඇත්තේ රට විවෘත වූ නිසාය. මෙරටදී ඉපයීමට අවස්ථා නැති, එහෙත් හැකියාව ඇති අයට විදේශගතව ඉපයීමට හැකි විය. විදේශ විනිමය සීමා අවමවීම නිසා අවශ්‍ය දෑ පරිභෝජනය කිරීමට අවස්ථාව හිමිවිය. ලෝකය පුරා සංචරණයට අවස්ථාව හිමිවිය. එහි ප්‍රථිපලය වූයේ ශක්තිමත් මධ්‍යම පන්තියක් රට තුළ නිර්මාණය වීමයි. එනම් සෑම කෙනාගේම හැකියාව මත පදනම්වූ ශ්‍රමයට වටිනාකමක් එදා විවෘත ආර්ථිකය ආරම්භයත් සමඟ ලැබුණා. විවෘත ආර්ථිකය තුළ එසේ අප ලැබූ සාර්ථක භාවයන් රාශියකි.

නමුත් එම ක්‍රමය සමාජයේ සියළු දෙනාට යහපත් වූයේ නැති බව පැහැදිලිය. විවෘත ආර්ථිකය ඉදිරියට යාමත් සමඟ එම ක්‍රමය පවත්වාගෙන යාමට අවශ්‍ය සමාජ හා දේශපාලන ප්‍රතිසංස්කරණ මෙන්ම නීතිමය පසුබිම නිර්මාණය නොවීමත්, සමාජයේ සියළු දෙනාට ශක්තිමත්ව එම ආර්ථික ක්‍රමය සමඟ බද්ධ වීමට නොහැකිවීමත් නිසා හැකියාව හා දක්ෂතාව නොමැති ජන තීරු තවදුරටත් දුගී බවට පත්විය. එමෙන්ම ඔවුන් සමාජයේ අව වරප්‍රසාදලාභීන් බවට පත් විය. එනම් ඔවුන්ට අධ්‍යාපනය නොමිලේ ලබා දුන්නද එය සාධාරණ ලෙස බෙදී ගියේ නැත. සෞඛ්‍ය හා අනෙක් සමාජ සුභසාධනයන් සාධාරණව හිමිවූයේ නැත. යටිතල පහසුකම් භුක්ති විඳීමේ අවස්ථා සාධාරණ වී නැත.

විවෘත ආර්ථිකය ක්‍රියාත්මක කරන ලද 1977 සිට සක්‍රිය දේශපාලනයේ සිට සවිඥානික දේශපාලනඥයෙක් ලෙස රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ඉහත ප්‍රකාශයන්ගෙන් කියා සිටින්නේ, අර්බුදයේ ස්වභාවය පමණක් නොව එයට විකල්ප විසඳුම් සෙවිය යුතු බවය. 2022 දී රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව සිය පළමු ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තුව අමතා ප්‍රකාශ කරන ලද්දේද පවත්නා ආර්ථික වැඩ පිළිවෙළට විකල්පයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය, සමාජීය වෙළෙඳපොල ආර්ථිකයක් (Social Market Economy) දෙසට ගමන් කරවීමට අවශ්‍ය බවය. ඒ අන් කිසිවක් නිසා නොව විවෘත ආර්ථික වැඩපිළිවලින් **"පමණක්ම"** සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට නොහැකි නිසාය. තවදුරටත් සමාජයේ ආන්තික සමාජ තීරුවලට මෙම ක්‍රමයෙන් ප්‍රතිලාභයක් අත් නොවීම නිරීක්ෂණය වන නිසාය. ඔවුන් අව වරප්‍රසාදිතයින් ලෙස විවෘත ආර්ථිකය තුළම ජීවත්වන නිසාය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා එහිදි වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද්දේ "සමාජ සාධාරණ කොමිසමක්" ද ඇති කරන බවය. මීට දශකයකට පමණ පෙර සිටම රනිල් වික්‍රමසිංහ මහතා මෙම අදහස ඉදිරිපත් කළා පමණක් නොව, එක්සත් ජාතික පක්ෂය රටට ඉදිරිපත් කරන ආර්ථික ප්‍රතිපත්තිය පදනම් වන්නේද, සමාජීය වෙළෙඳපොල ආර්ථිකයක් මත බව ප්‍රකාශ කර ඇත.

සමාජීය වෙළෙඳපොල ආර්ථිකය යනු, මාක්ස්වාදී සමාජ දේශපාලන ආර්ථික සාහිත්‍ය තුළ කියවෙන සමාජවාදි ආර්ථික ක්‍රමයක් හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සාකච්ඡා කරන ආර්ථිකයක් නොවන්නේය. ඒ අනුව සමාජීය වෙළෙඳපොල ආර්ථිකය යනු විවෘත ආර්ථිකයෙන් මිදියාමක් නොව විවෘත ආර්ථිකය තුළ විධිමත් හා ශක්තිමත් ලෙස සමාජ සුභසාධනය ඉහළ නැංවීමට ගන්නා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් සැකසීමක්ය. එය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන්නේ මෙසේය. **"රට වෙනුවෙන් කැපවීම් කරන සියලු දෙනාට, අප ගොඩනංවන නව ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යා යුතුයි. සැමට සමාන අවස්ථා නිර්මාණය විය යුතුයි. එය සමාජයේ කුඩා කණ්ඩායමක් පමණක් පොහොසතුන් කරන ආර්ථික ක්‍රමයක් නොව, සමස්ත සමාජයම ඉහළට ඔසාව තබන ආර්ථික ක්‍රමයක්."**

ජර්මන් කර්මික ආර්ථිකයේ මතු වූ උවමනාවන් මත සංකල්ප ගත වූ ක්‍රමයක් වන සමාජීය වෙළෙඳපොල ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කිරීමේදී එහි වැඩපිළිවෙළ එකාකාරව රාමුගත කර ගැනීම අවශ්‍ය නැති අතර ඒ ඒ රටවල සමාජ ආර්ථික හා දේශපාලන උවමනාවන් මත ගොඩනැගිය හැකි වනු ඇත. කෙසේ වෙතත් සමාජීය වෙළෙඳපොල ආර්ථිකයක මූලික ගති ලක්ෂණය වන්නේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති මත පදනම්වීමත්, ඒ තුළ විධිමත් බදු ප්‍රතිපත්තීන් අනුගමනය කරමින් ඉහළ රාජ්‍ය ආදාමක් පවත්වාගෙන යාමත්, ඒ හරහා ඇති කරන රාජ්‍ය වියදම් තුළින් සාමාජයේ සියළු දෙනාට ඉහළ සමාජ සුභසාධනයක් අත්කරදීමත් ය.

1977 දී විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමඟම අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කිරීම දෙසට කල් ඇතිව යොමු නොවීම විවෘත ආර්ථික ක්‍රමයේ අසාර්ථකභාවයන්ට හේතු වූ බව ඇතැම් ආර්ථික විශේෂඥයින්ගේ මතයයි. කෙසේ වෙතත් 1977න් පටන් ගත් දශකයේ අවසානය වන විට දැඩි ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට ශ්‍රී ලංකාව යොමුවීමට ක්‍රියා කළේය. එහිදී මෙරට ආර්ථික ප්‍රතිපත්තීන් ගොඩනැගෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව එවකට ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා සමඟය. ඒ ප්‍රකට වොෂින්ටන් සම්මුතිය මඟින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉදිරිපත් කළ ආර්ථික ප්‍රතිපත්ති කට්ටලය ශ්‍රී ලංකාවේද ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින්ය. එම යෝජනාවල මූලික හරය වූයේ ආර්ථිකයේ ලිහිල්කරණයට අදාල ප්‍රතිපත්ති අදාල රටවල් විසින් ක්‍රියාත්මක කිරීම හා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට රාජ්‍යයේ මැදිහත්වීම අවම කිරීමය.

ශ්‍රී ලංකාවේද වොෂින්ටන් සම්මුතියේ ප්‍රකාශිත යෝජනා ක්‍රියාත්මක කරන ලදි. එම යෝජනා නම්, මූල්‍ය විනයක් පවත්වාගෙන යමින් ගෙවුම් ශේෂය යහපත්ව පවත්වාගෙන යාම, රාජ්‍ය වියදම් ආපසු හරවා යැවීම නැතිනම් අධ්‍යපනය, සෞඛ්‍ය හා යටිතල පහසුකම් ඉලක්කකර වියදම් දැරීම, බදු ප්‍රතිසංස්කරණය ඇති කිරීම හා බදු පදනම පුළුල් කිරීම, පොලී අනුපාත ලිහිල්කරණය, තනි හා තරඟකාරී විනිමය අනුපාත ක්‍රමයක් පවත්වා ගැනීම, ජාත්‍යන්තර වෙළඳම සඳහා පවතින බාධක ඉවත් කිරීම, සෘජු විදේශ ආයෝජන සඳහා ඇති බාධක ඉවත් කිරීම, රජය සතු ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම, වෙළඳපල ප්‍රවේශය සහ තරඟකාරිත්වය නියාමනය කිරීම, සහ පෞද්ගලික දේපල අයිතිය සුරක්ෂිත කිරීම යන යෝජනාය.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමෙන්, අපේක්ෂා කරන ලද්දේ උද්ධමනය පාලනය කිරීම සහ රජයේ අයවැය හිඟය අඩු කිරීම මගින් ආර්ථික ස්ථාවරත්වයක් ඇති කිරීම, සමාජයේ සියළු දෙනා අතර සුභසාධනය සමාන තත්ත්වයකට ගෙන ඒම වැනි කරුණු වුවත් එම ඉලක්කයන් ජය ගැනීම අප රටේ පවා පෙන්වා ඇත්තේ මිශ්‍ර ඵළ තත්ත්වයකි. එම අසාර්ථකභාවය නිසාම වොෂින්ටන් සම්මුතිය මෙසේ ඉදිරිපත් ඉහත යෝජනා ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනාවලට අමතරව තවත් යෝජනා කට්ටලයක් සංවර්ධනය වෙමින් පැවැති රටවල් සඳහා ඉදිරිපත් කරන ලදි. එම යෝජනාවල විශේෂ යෝජනාවක් වූයේ ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළම, සමාජයේ අව වරප්‍රසාදිතයින් සඳහා අර්ථික ප්‍රතිසංස්කරණ මගින් සහන සැලැස්වීමය. ඒ අනුව වොෂින්ටන් සම්මුතියේ දෙවන ප්‍රතිපත්ති කට්ටලය වශයෙන් හඳුන්වයි. ඒ යෝජනා මගින් ඉදිරිපත් කරන්නේ ආර්ථිකයේ කටයුතු සඳහා යම් ආකාරයක රාජ්‍ය මැදිහත්වීමක් අවශ්‍ය බවත්, ඒ සමඟම සමාජයේ අව වරප්‍රසාදිතයින් සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයන් (Social Safety Nets) සකස් කරන ලෙසය.

එනම් "ආර්ථිකයේ නව පදනම" වන්නේ විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී සමජයේ උන්නතියට වැඩි අවධානයක් යොමු කරන ආකාරයේ වැඩපිළිවෙක් වෙත යාමය. ජනාධිපතිවරයා අවධාරණය කරන විකල්පය එයයි. ඒ අනුව ආර්ථික අවපාත අවස්ථාවලදී ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම, රැකියා අවස්ථා අහිමිවන්න්ට ජීවත්වීමට හැකි සුභසාධනයක් ඇති කිරීම, ව්‍යාපර අවස්ථා කඩා වැටෙන විට එයට අවශ්‍ය ආර්ථික පිටුවහල සැපයීම, වැනි ආරක්ෂිත ක්‍රම ඇති ආර්ථිකයක් ඇති කිරීමය. එමෙන්ම දුප්පතුන්, රෝගීන්, ආබාධිතයින් වෙනුවෙන් විධිමත් සමාජ ආරක්ෂණයක් ඇති කිරීම සහ අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය මෙන්ම යටිතල පහසුකම් සාධාරණ හා සමාන අයුරින් බෙදී යන ක්‍රමයක් ඇති කිරීමය. මේ වන විටත් ආරම්භ කර ඇති අස්වැසුම සුභසාධන වැඩසටහන, මෙන්ම සමාජ ආරක්ෂන ජාල වැඩසටහන සඳහා 2023 අයවැය මගින් රුපියල් මිලියන 4,300ක් වෙන් කර තිබීම වැනි ව්‍යාපෘතිවල අරමුණ වන්නේ විවෘත ආර්ථිකයේ ඔබ්බට යමින් එහෙත් එම ප්‍රතිපත්ති රාමුවම තුළ සෑම දෙනාටම ප්‍රතිලාභ හිමිවන ශක්තිමත් සමාජීය වෙළෙඳපොල ආර්ථිකයකට පිවිසීමය.

සරත් හේවගේ

# 2024 ජනාධිපතිවරණයේ බල කඳවුරුවල මායිම් කණු



ජවිපෙ නායක අනුර කුමාර දිසානායක පසුගිය දින කිහිපය තුළදී දිගින් දිගටම කීවේ ඉදිරි ජනාධිපතිවරණය කඳවුරු දෙකක් අතර සටනක් බවය. එහි එක් කඳවුරක් මාලිමාව නියෝජනය කරන බවත් සෙස්සන් අනෙක් කඳවුරේ බවත්ය. අනුරගේ මෙම නිශ්චිත වෙන් කිරීම ජවිපෙ හෝ මාලිමා පාක්ෂිකයන් චූන් කිරීමට හේතුවක් වීම විය හැකි වුවත් රටේ දේශපාලන වර්ධනයන් ගැන හරි හැටි අවබෝධයක් ඇත්තෙකුට මේ කියන වෙන් කිරීම හඳුනාගන්නට තරම් දේවල් දේශපාලන පිටිය තුළ සිදුව නැත. නමුත් අනුර පසුගියදා ජවිපෙ විසින් තමා ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කළ බව නිවේදනය කිරීමෙන් පසුව අනුරද ජනාධිපතිවරණයේ අපේක්ෂකයකු බවට සිය නම තහවුරු කරගෙන තිබේ. මෙමඟින් මාලිමාවට සම්බන්ධ හා ඊට කැමැත්තක් දැක්වූවන් විසින් මාලිමාවේ අපේක්ෂකයා විය යුත්තේ එහි පාර්ලිමේන්තු මන්ත්‍රිනී හරිණි අමරසූරිය බවට මතයක් රෝපණය කරමින් සිටි නිසා අනුරගේ නම් කිරීම මඟින් ජවිපෙට ගැටළුවක්ව තිබූ මාලිමාවේ අභ්‍යන්තර බල අරගලය ජවිපෙට වාසි වන ලෙස විසඳාගෙන තිබේ. ජවිපෙ මූලිකව මාලිමාව ලකුණින් ජාතික ජන බලවේගය ගොඩනැගුවේ ජවිපෙ සීමාන්තික දේශපාලනය, එහි වැඩ රටාව හා එයට එරෙහිව තිබුණු සමාජ අපවාදයන් මත බහුජන පක්ෂයක් ලෙස ගොඩනැඟීමේ නොහැකියාව ජයගැනීම වෙනුවෙනි. එහිදී රටේ දේශපාලනය ගැන කළකිරීමට ලක්ව සිටි පිරිස් ආකර්ශනය කරගැනීම වෙනුවෙන් විවිධ මතවාදවල ගොනු වී සිටි පිරිස් එකතුකර ගන්නා අතර එය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනික අනන්‍යතාවයක්ද ප්‍රකට කළේය. මේ නිසා පහළ මධ්‍යම පාංතික සමාජ ජීවිත ගත කරන පිරිස් ඊට ආකර්ශනය විය. හරිණි අමරසූරියලා නියෝජනය කරන්නේ ඒ මධ්‍යම පංතික අභිලාශයන්ය. ඒ නිසා මාලිමාව වටා ගොනු වුවන් බහුතරය හරිණි ජනාධිපති අපේක්ෂකයා වීම බලාපොරොත්තුවීම අහම්බයක් නොවේ. කෙසේ නමුත් අනුර අපේක්ෂකයා ලෙස ජවිපෙ ඒකපාක්ෂිකව හෝ තීන්දු කිරීම තුළ එම කඳවුර යම් සෙලවීමකට ලක්ව ඇති බවත් පෙනෙන්නට තිබේ. ඒ ගැටළුව ජවිපෙ කවරාකාරව විසඳා ගත්තත් අනුර පෙර සඳහන් කළ ආකාරයෙන් අනුර සහ අනෙක් කඳවුරක් ගැන කියන කතාවට එන්න තවම මාලිමා දේශපාලනය මෝරා නැත. මන්ද මේ කියන බෙදා වෙන් කිරීමට පදනම් වන නිශ්චිත විකල්ප දේශපාලනික හෝ ආර්ථිකමය හෝ කරුණු දැක්වීමක් කිරීමට ජවිපෙ හෝ මාලිමාව තවම සමත් නැති නිසාය.

කොහොම නමුත් තවම ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්ව නැති තත්වයන් හමුවේ දේශපාලන කඳවුරුවලට බෙදිවෙන්වීම තවමත් නිශ්චිත සිදුව නැතත් ජනාධිපති වික්‍රමසිංහ වටා පෙළගැසෙන බලවේග විසින් රනිල්ගේ කඳවුරක් නිර්මාණ කරමින් තිබේ. එය ඔහු ජනාධිපතිධුරයට පත් වූ දා සිට ක්‍රමක්‍රමයෙන් හෙමිහිට ආයාසයකින් තොරව සිදු වෙමින් පවතින්නකි. රනිල් තමන්ගේ කඳවුර මේ යැයි ලකුණු නොකළද මේ වන විට ඒ හැකියාව ඔහුට තිබේ.

වත්මන් දේශපාලනය තේරුම් ගතයුත්තේ එතැන සිටය. මන්ද දේශපාලන සටන, හුදු ජනප්‍රිය කටවාචාල කතා වෙනුවට ප්‍රතිපත්තිමය කරුණු මත කෙරෙන්නක් බවට වෙන් කළේ රනිල් විසින් නිසාය. රට මුහුණ දෙමින් සිටි අර්බුදය හමුවේ සමස්ත ක්‍රම පද්ධතියම වෙනස් කිරීමේ නැතිනම් ජන අරගලය විසින්ද ඉල්ලා සිටි සිස්ටම් චේන්ජ් එක වෙනුවෙන් ඒ අභියෝගය භාරගත්තේ රනිල්ය. ඔහු එය දැඩි අසීරුතා මධ්‍යයේ හෝ සිදු කරමින් තිබේ. ඒ වෙනුවෙන් ආර්ථික හා දේශපාලනික ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කරනු ලැබුවේ නව ප්‍රතිපත්ති සැලසුම් වැඩපිළිවෙල මතය. වසර 75ක් අනුගමනය කළ ප්‍රතිපත්ති, විවෘත ආර්ථිකය හඳුන්වා දුන් 1978 සිට අනුගමනය කළ ප්‍රතිපත්තීන් පවා යල් පැන ගොස් ඇති බවත් එය වෙනස් කළ යුතු බවත් කීවේය. ඒ වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග දැන් ඔහු ගෙන තිබේ. සමාජ සාධාරණත්වය පදනම් කරගත් වෙළඳපොළ ආර්ථිකයක් ගොඩනැගීම වෙනුවෙන් දේශපාලන ආර්ථික ප්‍රතිපත්තීන් වෙනස් කරමින් තිබේ. මෙම එළඹුම යුගයේ සමාජ ආර්ථික විප්ලවයක මුහුණුවරක් ගන්නා තැනට පත්ව තිබීමත් විද්‍යාමාන වෙමින් තිබේ. රනිල්ගේ කඳවුර නිර්මාණය වන්නේ එතැනිනි.

මේ අනුව ඉදිරි ජනාධිපතිවරණයේදී කවර කඳවුරක් ගොඩනැගුනත් කවරෙක් ඊට නායකත්වය දුන්නත්, ඊට අභියෝගය එල්ල වන්නේ රනිල්ගෙනි. රනිල් අභිබවා යන ප්‍රතිපත්තිමය කරනාවලින් සන්නද්ධව ඔහු සමඟ සටන් කිරීමට එන කවරෙකු වුවත් පැමිණිය යුතුය. නමුත් මේ වන විට දේශපාලන වර්ධනයන් පෙන්වා දෙන්නේ රනිල් ශක්තිමත් වීම හැර වෙනකක් නොවේ. විපක්ෂ කොටස් වලට තවම ගන්න හදාගෙන අවසන් කරගැනීමට නොහැකිව සිටී. මෙහිදි විශාලම අර්බුදයකට ගොදුරුව සිටින්නේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස සහ ඔහුගේ සමගි ජන බලවේගයය.

රට අර්බුදයකට ගොදුරුව තිබුණු මොහොතේ පුරවැසි ජනතාව රජය කෙරෙහි වන අකමැත්ත ප්‍රකාශ කිරීමට විවිධ වේදිකා බාවිතා කළ අතර සමගි ජන බලවේගය කියන්නේද එවැනි එක් වේදිකාවකි. ඒ හැඳුනු රැල්ල තමන්ව ජනාධිපතිධුරය කරා ගෙන යනු ඇතැයි සජිත් කල්පනා කළේය. ඔහුගේ පාක්ෂිකයන්ද එසේ කල්පනා කළේය.

සජිත් මැතිවරණයක් ඉල්ලා දිගටම හඬා වැළපෙන්න ගත්තේ ඒ නිසාය. රජය ගන්නා සෑම පියවරකටම විරුද්ධ වෙමින් තමන් ජනතාවගේ අසම සම නායකයා ලෙසින් පෙනී සිටින්නට උත්සහ කළේ ඒ නිසාය. ජනතාවට ප්‍රශ්න නොවුණු දේත් ජනතාවගේ ප්‍රශ්න ලෙස නිර්මාණය කරමින් කියව කියවා යන්න ගත්තෙත් ඒ නිසාය. අවසානයේ රටට විහිළුවක් වීම හැර වෙනකක් සජිත් තවම දිනා ගෙන නැත.

මේ අතර සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් ක්‍රමයෙන් සජිත් ප්‍රේමදාසගෙන් ඉවත්වීම පසුගිය කාලය තුළ පෙනෙන්ට තිබිණි. ඒ අනුව සජිත් ප්‍රේමදාසට හිතවත් සුළු පිරිසක් පමණක් ඔහු වටා සිටියද එය එළඹෙන වර්ෂයේ පැවැත්වීමට අදාළ ජනාධිපතිවරය සඳහා ශක්තිමත් පදනමක් ඒ අනුව ඔහුට සකසන්නේ නැත. මේ බව පක්ෂ අභ්‍යන්තරයේ ද සාකච්ඡාවට ලක්ව තිබූ අතර සජිත් ප්‍රේමදාස ජනාධිපතිවරයා සමඟ එක්ව ආණ්ඩුව සහාය දැක්විය යුතු බව සජබ මන්ත්‍රිනි රෝහිණී කවිරත්න විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටියේ මේ ගැටළුවට පිළියමක් ලෙසය. ඒ පක්ෂය රැකගැනීම වෙනුවෙන් කළ අවංක ප්‍රකාශයක් විය. නමුත් සජිත් එය තේරුම් ගත්තේ නැත. සජිත්ගේ සමීපතම අනුගාමිකයන්ගේ බලාපොරොත්තුව ද සජිත් ජනාධිපති අපේක්ෂකයා කිරීමය. පසුගිය කාලයේ සජබයේ හර්ෂණ, මරික්කාර් වැනි මන්ත්‍රීවරු නිශ්චිත ලෙස ප්‍රකාශ කර තිබුණේ සජිත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බවය. මේ අය කල්පනා කළේ විපක්ෂයට වී සිටින වියත්මග කණ්ඩායම, ජී.එල්. - ඩලස් කණ්ඩායම, ශ්‍රී ලනිපය, විමල්ගේ කණ්ඩායම, දෙමළ මුස්ලිම් පක්ෂ සියල්ල එකතු කරගත් මහා සන්ධානයක් ගොඩ නගමින් සජිත්ව පොදු අපේක්ෂකයා කරගැනීම සිදු වෙනු ඇත බවය. නමුත් ඒ සියල්ල දැන් හබක්ය. අවසානයේ ඩලස් ජනාධිපතිවරණ අපේක්ෂකයා කරමින් සජිත් පස්ස ගසන තැනටද පත්ව තිබූ නමුත් ඩලස්, සජිත්ව අත්හැර අනුර පසුපස වැටිනි. මේ අනුව ඉදිරි ජනාධිපතිවරණයට කවුරු ඉදිරිපත් වුවත් සජිත් ප්‍රේමදාස නම් ඉදිරිපත් නොවන බව සැකයක් නැතිව කිව හැකිව තිබේ. ඒ අනුව සජිත් ප්‍රේමදාසගේ දේශපාලන සිහිනය කෙමෙන් නමුත් වේගයෙන් වියැකී යමින් පවතී.


> රනිල් තමන්ගේ කඳවුර මේ යැයි ලකුණු නොකළද මේ වන විට ඒ හැකියාව ඔහුට තිබේ. වත්මන් දේශපාලනය තේරුම් ගතයුත්තේ එතැන සිටය. මන්ද දේශපාලන සටන, හුදු ජනප්‍රිය කටවාචාල කතා වෙනුවට ප්‍රතිපත්තිමය කරුණු මත කෙරෙන්නක් බවට වෙන් කළේ රනිල් විසින් නිසාය. රට මුහුණ දෙමින් සිටි අර්බුදය හමුවේ සමස්ත ක්‍රම පද්ධතියම වෙනස් කිරීමේ නැතිනම් ජන අරගලය විසින්ද ඉල්ලා සිටි සිස්ටම් චේන්ජ් එක වෙනුවෙන් ඒ අභියෝගය භාරගත්තේ රනිල්ය. ඔහු එය දැඩි අසීරුතා මධ්‍යයේ හෝ සිදු කරමින් තිබේ.


මේ අතරතුර ජවිපෙ හා ඩලස් පාර්ශ්වය අතර සාකච්ඡාවට සමාජයේ අවධානය යොමුව තිබේ. පසුගියදා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී මෙම සාකච්ඡා පැවැත්විය. ඩලස් සමඟ වන නිදහස ජනතා සභාවේ සාමාජිකයන් ජවිපෙ නායකයන් හමුවන්නේ තවත් සන්ධානයක් ඇටවීමට බව දේශපාලන ක්ෂේත්‍රයේ දැඩි කතා බහට ලක්ව ඇති කරුණකි. ඒ කොහොම නමුත් ඩලස්ගෙන් ජවිපෙට ඇති වැඩේ කුමක්ද යන්න දන්නේ ජවිපෙය. 1994 දී ජවිපෙට සම්බන්ධ ලක්දිව පුවත්පතෙහි ලියන්නෙකු ලෙස සේවය කරන ඩලස් ඉන් අනතුරුව චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ පැමිණීමත් සමග ශ්‍රීලනිපයෙන් මාතර දිස්ත්‍රික්කයෙන් තරඟ වැදී පාර්ලිමේන්තුවට තේරී පත්වන්නේය. ඒ මංගල සමරවීරගේ නායකත්වය යටතේය. කෙසේ නමුත් මෙසේ දිවෙන ඩලස්ගේ දේශපාලනය, කලකිරීම මුල් කරගෙන අත්හැරෙන අතර ඇමරිකාව බලා පිටත් වන්නේය. එහි ගොස් දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවකට සම්බන්ධ වුවත් 2005 දී පැවැත්වෙන ජනාධිපතිවරණය මුල් කරගෙන නැවත පැමිණෙන්නේ මහින්ද රාජපක්ෂට සහයෝගය ලබා දීමේ අරමුණෙනි. අනතුරුව ඔහු ජනාධිපතිවීමෙන් පසුව ඇමති ධුරයන්ට පත්වන ඔහු පසුගිය ගෝඨාභය රාජපක්ෂ පාලනයේදී ද ඇමති ධුර දෙකකට මාරු වූ අතර එහිදී ආණ්ඩුවේ අසාර්ථකත්වයට සහ රට බංකොළොත් කිරීමට වගකිව යුත්තෙකි.

කෙසේ නමුත් ගෝඨාභයගේ අවසන් කාලයේදී අගමැති ධුරය බලාපොරොත්තුව සිටි නමුත් එය නොලැබුණු තැන ආණ්ඩුවෙන් ඉවත් වූ ඔහු ඉක්නින්ම කළේ දෑත් සෝදාගැනීමය. ඒ පොදු ජන පෙරමුණේ සිටි පිරිසක් සමඟ ස්වාධීන වීමක් ප්‍රකාශ කරමිනි. පාර්ලිමේන්තු ජනාධිපතිවරණයේ රනිල් වික්‍රමසිංහගේ ප්‍රතිවාදියා ලෙස සජිත්, ඩලස්ව නම් කළේය. මෙයින් පසුවත් ඔහු ජනාධිපති, අගමැති සිහිනය අත්හැරීමට කැමති නොවූ අතර ඒ වෙනුවෙන් විවිධ පාර්ශ්වයන් සමඟ විවිධ උපක්‍රම භාවිතාවට ගනිමින් සිටී. ජවිපෙ සමඟ සාකච්ඡාවද ඒ එක් පියවරකි. කෙසේ නමුත් ජවිපෙට ද ඩලස් වැන්න වුන්ගේ සහය අවශ්‍යව තිබෙන බවත් එම පාර්ශ්වයෙන් ඇසෙන කතන්දර අනුව පැහැදිලිය. වරෙක ලාල් කාන්ත කීවේ ඩලස් වැනි හොඳ අය සමඟ ගනුදෙනුවකට යෑම වරදක් නැති බවය. මෑතක ඩිලාන් කියා තිබුණේ තමන්ගේ පියා ජවිපෙ සාමාජිකයකු බැවින් තමන්ට ජවිපෙ හා කටයුතු කිරීමේ සුදුසුකමක් තිබෙන බවය. දෙපාර්ශ්වය තම තමන්ගේ ගැලැප්පීමට අවශ්‍ය පොරොන්දම් සොයමින් සිටින බව මේ අනුව පැහැදිලිය. නමුත් මේ තත්වයන් අනුව අනුර තමන්ගේ කඳවුරේ තිබෙනවා කියන කන්‍යාභාවය නම් සිය කැමැත්තෙන්ම බිඳගැනීමක් වනු ඇත.

මේ අතර විමල් වීරවංශ පාර්ශ්වය සහ ජවිපෙ අතරත් තෙවන පාර්ශ්වයක මැදිහත් වීමක් හරහා දැන් කාලයක් සිට රහසිගත සාකච්ඡා වට කිහිපයක්ම සිදුවෙමින් පැවැතිනි. මේ වන විට එහි යම් සාර්ථකත්වයක් ඇතිව තිබෙන ලකුණු පහළවද ඇත. ඒ මෙතුවක් කල් ද්‍රෝහියකු ලෙස හංවඩු ගැසූ විමල්ව දැන් ජවිපෙ ඇතැමුන් විසින් සහෝදරයා ලෙස හඳුන්වන්නට ඉදිරිපත් වීම තුළය. මේ කියන තෙවන පාර්ශ්වය දේශපාලන ගේම්වලට ප්‍රසිද්ධ පුද්ගලයකු වන අතර ඩලස් හා ජවිපෙ අතර කපුකමටද මේ ඔහු මැදිහත්ව තිබිණි.

කොහොම නමුත් මේ වන විට ජනාධිපති රනිල් සිය කඳවුර ස්ථාවර කරගනිමින් තිබෙන නමුත් ආණ්ඩු බලය අත්පත්කර ගැනීමට තරම් තමන්ට රැල්ලක් ඇති බව කියන සජබය සහ ජාජබය තවමත් ගතකරන්නේ තමන්ගේ කඳවුරේ සීමාව සොයාගැනීමට නොහැකිව බව පැහැදිලිය.

කේ.පී.අයි. ප්‍රියංගනී



# මිනිසුන් ඉල්ලා සිටින්නේ නාස්ප වෙනුවට පාලම්ය

ළිදේ ඉන්න ගෙම්බාට බාහිර ලෝකය පෙනෙන දැනෙන ආකාරයේ සීමාසහිත බව ගැන අමුතුවෙන් කිව යුතු නැත. ඒ නිසා ඒ බාහිර ලෝකය ගැන වැඩිමනත් තිබිය හැක්කේ මිත්‍යාමය අදහස් පමණි. ඒ මත ඇතැම්විට දාර්ශනික ප්‍රවාද, ආගමික මත ආදී දේවල්ද බිහිවිය හැකිය. අවශ්‍ය කෙනෙකුට ළිඳෙන් එහා ලෝකය ගැන බොරු බේගල් කියා රැවටිය ද හැකිය. ඒ කොහොම වුණත් ළිදේ ගෙම්බා අනෙක් ළිං ගෙම්බන් ළිඳෙන් එපිටට යාම ගැනත් විරුද්ධය. මන්ද යථාර්ථය අත්දකින වුන් සිටින තරමට තමන්ගේ පැවැත්මට කෙළවෙන බව අත්දැකීමෙන් දන්නා බැවිනි. ඒ නිසා ළිඳෙන් එපිට ලෝකය ගැන බොරු බේගල් ඇද දමා අනෙකා භීතියට පත් කරයි. තමන්ගේ පැවැත්ම අර්බුදයකට යෑම ගැන දැනගෙන එය දරාගැනීමට නොහැකිව මානසිකව අසනීප වූ විට තත්වයන් තවත් භයානකය. ලොකුම පිස්සු කෙලීම් කරන්නේ මෙහෙම ගෙම්බන්ය. ඒ අතර ආගමික සහ දේශපාලනික ගෙම්බන් ප්‍රමුඛය.

පසුගියදා මැල්කම් රංජිත් කාදිනල් උන්නාන්සේ රාගම තේවත්ත බැසිලිකාවේ පැවැති දේව මෙහෙයකට එක් වෙමින් තමන්ගේ ආගමික වපසරියට අයත් නොවන නමුත් ආගමික විශ්වාසයක් බවට පත් කරගෙන තිබෙන විකාර හණමිටි අදහසක් ප්‍රකාශයට පත් කර තිබිණි. මෙය අලුත් නොවන පරණ කතාවකි. එය මේ රටේ ජාතිකවාදී වාමාංශික හණමිටිකාරයන් පට්ට ගැසූ සහ තවමත් දොඩවන කතාවකි. එය මෙසේය,

**"අපේ රටේ කෑලි කෑලි විකුණ විකුණ එක එක රටවලට, එක එක බලවේගවලට යටත් වෙමින් විවිධ මෝඩ තීරණ ගනිමින් මේ රට විනාශය කරා ගෙන යන්නට කටයුතු කරමින් සිටිනවා. ඒ ගොල්ලෝ ඉන්දියාවට පාලමක් හදනවලු. දැන් ඉන්දියාවෙන් අපිට තියෙන ප්‍රශ්න මදැයි. ඔබට මතකයි පරිප්පු ගෙනත් දැම්මා එක කාලෙක. හමුදාවක් එව්වා ලංකාවට. ඔබට මතකයි ඒ අයගේ මතය මත යම් යම් දේවල් ක්‍රියාත්මක කළ යුතුයි කියලා අපිට බල කෙරුවා. බල කරලා ඒවා අපේ කර උඩ පැටෙව්වා. තව පාලමකුත් හදාගත්තාම හොඳට තියෙයි. කවුද මේ මෝඩ කතා කියන්නේ. අපේ රට හැමදාම නිදහස් රටක්. කවදාවත් අපි කිසිම රාජ්‍යයක වහල්ලු වෙලා ඉඳලා නෑ. වෙන රටකින් කැඩිලා ගියේ නෑ. ලංකාව එදා ඉඳලම තිබුණේ වෙනම. මේ රටේ රජවරු ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර තිබුණ ආර්ථික ගනුදෙනුවලට ගනුදෙනු කළා මිසක් අපි වහල්කම් කරන්න ගියේ නෑ කාටවත්ම. විදේශීය ජාතියකට අපේ රට යට වුණා නම්, යට වුණේ ආදරණීය සහෝදර සහෝදරියණි, අපේ නායකයින්ගේ පාවාදීම නිසයි. හෙටත් ඒ දේ වෙන්න පුළුවන්. මේ පාලමක් හැදීම පිළිබඳ අදහස සඳහා විශේෂ මහජන මත විමසුමක් ඇති කළ යුතුයි. මහජනතාවගේ මතය නැතිව මේ දේවල් කිරීම වැරදියි. අපේ රට වෙනුවෙන් අපි ඇත්තටම අද කණගාටු වෙනවා. නිදහස ලැබුවාට පස්සේ, අපිට තියෙන්නේ දැන් නිදහස නැති කරගන්න. ඉඩම් අක්කර දහස් ගණන් දෙමු අපි ඔක්කෝම රටවල්වලට. කෑලි කෑලිවලට කඩලා දෙමු හරි හොඳයි. එතකොට අපිට කිසිදෙයක් ඉතුරුවෙන්නේ නෑ. මේක අසනීපයක්."**

මේ අනුව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව ගොඩබිමෙන් යා කරමින් පාලමක් ඉදි කිරීම ගැන මේ දිනවල ඇතිව තිබෙන කතිකාව පමණක් නොව ඉන්දියාවට සහ විදේශීය ආයෝජන ලෙස මෙරට සිදු කරන සකලාකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට කාදිනල් උන්නාන්සේ විරුද්ධය. ඔහුට මෙවැනි සංවර්ධන ක්‍රියාදාමයන් ගැන කතා කරන්නේ අසනීපකාරයන්ය.

සාමාන්‍ය කතාවට අනුව පිස්සෙක් තමන්ට පිස්සු බව පිළිනොගන්නා අතර සෙස්සන් පිස්සන් බව කියයි. මෙය හරියට තමන්ගේ ආගම මොනතරම් මිත්‍යාවක් වුවත් අනෙක් ආගම් සියල්ල මිත්‍යාවන් බව පවසනවා බඳුය. පෘතුගීසිකාරයා ලංකාවට කිතුනු දහම අරගෙන ආවෙත්, එය බලහත්කාරයෙන් මෙරට තුළ ප්‍රචාරය කළේත් මෙරට තිබූ බුදු දහම මිත්‍යා දහමක් බව කියමිනි. එය කෙසේ වෙතත් අද මිත්‍යාව කුමක්ද, සත්‍යය කුමක්ද කියා තේරුම් ගැනීමේ හැකියාව බහුතර සාමාන්‍ය ජනතාවට තිබේ. නමුත් මිත්‍යාවක් බව දැන දැනම මිත්‍යාව පිළිගනිමින් සිටින මිනිසුන්ද වෙයි. එය වෙන කැමැත්තකි. පරණ හණමිටි කරගහගෙන යන මිනිස්සුද එහෙමය. තමන්ට වැඩක් නැති වුවත් අනුන්ට වැඩක් නැති වුණත් එය කරගහගෙන යෑම ඔවුන්ගේ අසරණකමය. තමන්ගේ පැවැත්ම තිබෙන්නේ ඒ මතය පිළිගන්නා තෙක් බව ඔවුන් විශ්වාස කරයි. එහෙම අයට අනුකම්පා කරනවා හැර වෙන කරන්න දෙයක් නැත. එහෙම අයට දැනුම කොටා පෙව්වත් ඒවා වැඩ කරන්නේ නැත. කාලය විසින්ම ඒ අයව ක්ෂය කර දමනවා විනා වෙන විසඳුම් ද නැත. එහෙත් මේ අය තමන්ගේ මතය නිවැරදි බව කියමින් අන්‍යයන්ට කරන බලහත්කාරී බලපෑමට පීඩනයට නම් කිසිසේත් ඉඩ දිය යුතු නැත. පිළිලයක් මෙන් වන මේ විසකුරු දේවල් ගලවා දැමිය හැකි නම් එය රටකට සමාජයකට යහපතක්ම විය හැකිය. මන්ද එහෙම කළ රටවල් ලෝකයේ පවතින අතරම අතිශය සංවර්ධනාත්මක තත්වයන් ද අත්පත් කරගෙන තිබෙන නිසාය.

## විකුණාගෙන කෑමේ වාසිය

රට විකුණනවාය, විකුණාගෙන කනවාය කියමින් හැමදාමත් ඇහෙන අඳෝනාව නඟන්නෙම, ගෝලීය ආර්ථිකය, දේශපාලනය, සමාජ සංස්කෘතික තත්වයන් සහ ඒ අත්පත් කරගෙන තිබෙන ජයග්‍රහණයන් ගැන කිසිවක් නොදන්නා ළිං මැඩි වර්ගයේ අසනීපකාරයන්ය. නමුත් මේ අය තමන්ගේ පැවැත්මට මේ අය කියන "විකුණාගෙන කෑම" විසින්ම අත්පත් කරගෙන තිබෙන ජයග්‍රහණයන් ද යොදාගෙන තිබෙන බවත් අවශ්‍ය නම් පෙන්වා දිය හැකිය. නමුත් මේ අය එය කියන්නේ නැත. එතරම්ම මුන් තක්කඩියන්ය, කුහකයන්ය. කාදිනල් උන්නාන්සේගේ තර්කය විදියට බටහිර ජාතීන්ට මේ රට, මේ රටේ මිනිස්සු විසින් (ඒ කියන්නේ සිංහල ජාතිය බෞද්ධ ආගමිකයන් විය යුතුය) පාවා දීම නිසා විනාශයක් සිදු කර ගෙන තිබේ. ඒ අනුව කිතුනු දහම මේ රටේ මිනිස්සු වැළඳගැනීම මෙන්ම ඒ ආගමික සිද්ධස්ථාන වෙනුවෙන් මෙරට භූමියේ ඉඩ කඩක් වෙන්වීමද මේ පාවා දීමේ ප්‍රතිපලයකි. එසේ නොවන්න මේ රටේ කාදිනල්වරයකු තබා කිතුනු පූජකයකු හෝ සිටිය නොහැක. කාදිනල්වරයාට රටේ දේශපාලනයට ඇඟිළි ගසමින් රට ගිනි තියන්න අවස්ථාවක්ද නොලැබෙනු ඇත. පාප් වහන්සේ හමුවේ ගතු කියා රටට පමණක් නොව තම ආගමික සංස්ථාවේ සෙසු පූජකයන්ට කෙලවන්න උත්සහ ගැනීමක් වන්නේ ද නැත. නමුත් ඇත්ත කතාව බටහිර ජාතීන් නිසා මේ රටට විනාශයකට වඩා සිදු වූයේ රට ගෙ ාඩනැඟීමත් සෙසු ලෝකයා හා සමගාමී සංවර්ධනයක් අත්පත් කරගැනීමත්ය. ඒ සත්‍යය ප්‍රතික්ශේප කළ නොහැක. බටහිරයන් නිසා රට බහු වාර්ගිකත්වය පිළිගන්නා, බහුත්වවාදී සාම්‍යයෙන් යුතු රටක්, ප්‍රජාතන්ත්‍රවාදී රටක් වීමම ලැබූ දැවැන්ත ජයගග්‍රහණයකි. තවදුරටත් ගෝත්‍රික ඇවැතුම් පැවැතුම් ඇති ළිංමැඩි වර්ගයේ සුළු පිරිසක් ඉතිරිව සිටියද රටේ සංවර්ධනයට ඔවුන්ගේ නිරන්තර බාධා කිරීම් වුවද සමස්තයක් ලෙස රට පවතින්නේ දියුණුවේ දිශාවට ගමන් කරන ශිෂ්ඨ සම්පන්න රටක් ලෙසය. ඒ විදේශීයයන්ගෙන් ලැබුණු දායදයය. රට විකුණාගෙන කෑවාය කියන කාරණාව පෙන්වා දීමට යොදාගන්නා සිදුවීම් කිහිපයක් පමණක් සලකා බැලුවත් මේ කියන 'විකුණාගෙන කෑම' නිසාම රටට අත්පත් වූ දැවැන්ත ජයගහණයන් ගැන ප්‍රමාණාත්මක අවබෝධයක්, සිහි බුද්ධියක් නැති පුරවැසියකුට වුව ලැබිය හැකි තරමට එය විශාලය.

සුද්දා මේ රට භාර දී ගියේ හූරගෙන කා හපයක් කර නොවේ. එහෙම හූරගෙන කන්න තරම් දෙයක් රටේ තිබුණෙත් නැත. අනෙක ඒ කාපු දෙයටත් වඩා ප්‍රතිලාභ රටට ලබා දී තිබේ. මේ රට ආසියානු ආර්ථිකයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම සඳහා වන සැලසුම්, ක්‍රමවේදයන්ද, මහා මාර්ග, දුම්රිය මාර්ග, ගුවන් ප්‍රවාහනය ඇතුළ යටිතල පහසුකම් ද, මහා කර්මාන්ත, කෘෂිකර්මාන්තය ද, ජාත්‍යන්තර වෙළඳාම, අධ්‍යාපනය සෞඛ්‍ය වැනි පුළුල් සේවාවන්ද ආදී ක්ෂේත්‍ර ගණනාවක්ම ඔවුන් ගොඩනැගුවේය. අනාගතය වෙනුවෙන් වන මාර්ග සිතියම ද සකසා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක්, ආචාර ධර්ම පද්ධතියක් පමණක් නොව රටේ සංස්කෘතියක් කියා දෙයක් විධිමත්ව සකස්කර දුන්නේද සුද්දා කීවාට වැරදි නැත. ඒ තබා විධිමත් භාෂා භාවිතයක් සකස්කර දුන්නේද සුද්දාය. රටට ප්‍රෞඪ ඉතිහාසයක් ඇති බව පාදා දුන්නේ සුද්දාය. රටේ භූ ගෝලීය වටිනාකම ගැන කියා දුන්නෙත් සුද්දාය. නමුත් සුද්දාගෙන් ලැබුණු දේශපාලන ආර්ථික නිදහස යනු කුමක්දැයිවත් නොදන්නා වුන් සිදුකළේ සියල්ල කාබාසීනියා කරදැමීමය. විජාතිකකරණයෙන්, බටහිර අධිරාජ්‍යන්ගෙන්, යැංකි සංස්කෘතියෙන් රට ගලවාගන්න කියා කළ පිස්සු කෙළීම් නිසා රට බංකොලොත් භාවය දක්වා රැගෙන ආවේය. මේ ඊනියා දේශප්‍රේමීන් රටේ ආර්ථිකයේ ප්‍රධානම අංශයක් වූ විදේශීය ආයෝජකයන් පන්නා දමන තැනට පත් විය. එම ව්‍යාපාර කර්මාන්ත රජයට පවරාගෙන විනාශ කරගත්තේය. දේශීය පෞද්ගලික අංශයේ හෝ ව්‍යාපාරයක් පවත්වගෙන යෑම අහෝසි කරන තැන දක්වා කටයුතු යෙදුනු කාලවල් තිබිණි.

## 75 වසරක දියුණුව

එමෙන්ම වඩාත් නිවැරදි ආර්ථික ක්‍රමවේදයන් වෙතට යෑමට ඇතැම් යුගවල ගත් උත්සහයන්ද බටහිර ධනවාදී ලිබරල් කුමන්ත්‍රණ කියමින් පරාජය කරන්න නිතරම කටයුතු කරන ලදී. ඒ සියල්ල කර අවසානයේ රට බංකොලොත් වූ පසු 75 වසරක සාපය යැයි කියමින් අනෙකෙකුට බැන වදිමින් සිටින පජාත තැනට මේ ඊනියා දේශප්‍රේමීන් පත්විය. කාදිනල් උන්නාන්සේගේ ප්‍රකාශය ද ඇද වැටෙන්නේ ද මේ ඊනියා දේශප්‍රේමයක් කරපින්නා ගත් ජාතිකවාදීන්ගේ සහ වාමාංශිකයන්ගේ කුලකයටමය.

මේ අයට අනුව කොළඹ වරාය විදේශීය ආයෝජකයන් ලවා සංවර්ධනය කර, රටට විශාල ආදායමක් ගෙන එමින්, ආසියාවේ හොඳම කාර්යක්ෂමම වරායක් බවට පත්කරගැනීම, ලෝකයේ 23 වැනි හොඳම වරාය බවට

09 පිටුවට

08 පිටුවෙන් පත්කර ගැනීම රට විකුණාගෙන කෑමක්ය. එදා වරාය එලෙස සංවර්ධනය කර නොගත්තා නම් කොළඹ වරාය වෙනුවට අදත් පවතින්න ඉඩ තිබුණේ කොලොම්තොට වක්කලමය. හම්බන්තොට වරාය චීන සමාගමකට බදු නොදී, මේක විකුණාගෙන කනවා කියමින් විගඩම් නැටුවුන්ට අවශ්‍ය ලෙස කටයුතු කළා නම් වරාය ඉදිකිරීමට ගත් ණය ගෙවාගත නොහැකිව අද එය චීනයට සින්නකරවම පවරාදීමට සිදු වන්නටත් ඉඩ තිබිණි. කොළඹ වරාය නැගෙනහිර ජැටිය විදේශ ආයෝජයකයන් ලවා සංවර්ධනය කිරීමට හණමිටි දේශපාලන පක්ෂ, තක්කඩි වෘත්තීය සමිතිකාරයනුත් ඉඩ නොදීමෙන් වරාය තවදුරටත් සංවර්ධනය කර රටට ලැබිය හැකිව තිබූ ප්‍රතිලාභයන් අහිමි කරගත්තේය. එය රටේ ජාතික සම්පතක් කියමින් බදාගත් අතර එහි සංවර්ධනය ඇණහිට තිබේ. වත්මන් රජයට ඒ වෙනුවෙන් යළි ආයෝජකයන් සොයන්නට සිදුව තිබේ. ඒ අතර බටහිර ජැටිය විදේශ ආයෝජකකුට දීමට ගත් උත්සාහයත් වැලැක්වීමට ජරමර ගොඩක් කළ නමුදු ඊට විදේශ ආයෝජකයකු ගෙන්වා ගැනීමට, රටේ වාසනාවට සමත් විය. මෙම ආයතන සංවර්ධන ක්‍රියාවලිය යනු බදු දීමේ හෝ රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධතාවය පදනමින් හෝ සීමාසහිත කාලයකට ව්‍යාපාරයක් ලෙස දියුණු කිරීම විනා විකුණා දැමීමක් නොවේ. මන්ද ඒ වැය බර රටට දරන්න අපහසු නිසාය. එහෙත් ළිං මැඩියන් සිතන්නේ ඒවා විකුණා දමන බවය. නිකම් මලකඩ කකා තිබූ ත්‍රි'මලේ තෙල් ටැංකි සමූහයෙන් වැඩක් ගන්න ආයෝජකයන් කැඳවන විටත් කීවේ ජාතික සම්පත් විකුනාගෙන කන බවය. ත්‍රි'මලේ තෙල් ටැංකි කිහිපයක් හෝ බදු දීමට කටයුතු කිරීමෙන් රටේ බලශක්ති ප්‍රශ්නය යම්තාක් දුරකට විසඳාගෙන අමතර ආදායමක්ද රජයට උපයාගැනීමට හැකිව තිබේ. ඉතිරි ටැංකි ප්‍රමාණයත් එවැනි ආකාරයේ විදේශ ආයෝජකයන් වෙත බදු දී රටට ප්‍රතිලාභ අත්පත් කරගැනීමට කටයුතු කළ යුතුව තිබෙන්නකි. මෙරට පැවැති තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව පෞද්ගලිකකරණය කිරීමට තීරණය කළ මොහොතේ නටපු ජෝගිය අනුව එය අකුළාගැනීමට එදා රජය පියවර ගත්තා නම් තවමත් දුරකතන සම්බන්ධතාවයක් ලබා ගැනීමට වසර ගණනක් පෝලිමේ ළගින්න වීම වෙනු ඇත. සාම්පූර් ගල් අඟුරු බලාගාරය ගොඩනැගීමට ඉඩ නොදී ඒ වලක්වාලීම රටේ විදුලි අර්බුදයකට හේතු වූ බව අමුතුවෙන් කිව යුතු නැත. මන්නාරම සුළං සහ සූර්ය විදුලි බලාගාර වෙනුවෙන් විදේශ අයෝජකයන්ට ඉඩකඩම් ලබාදෙන විටත් රට විකුණාගෙන කෑමක් ලෙස කියැවිනි. කොටින්ම ඉන්දියාවෙන් නොමිලයේ ලැබුණු සුවසැරිය ගිලන් රථ ටිකද ආපසු හරවා යවන්නට තරම් මේ ළිංමැඩියන් ටික වලි කෑවේය. එතරම්ම සාහසික මුග්ධ තැනකට මේ අය ඇද වැටී තිබිණි. මේ ආකාරයෙන් තවත් උදාහරණ රැසක් සටහන් කළ හැකිය. විදේශ ආයෝජකයන් කැඳවීම, රජයේ දේපොළක් බදු දීම, රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ ව්‍යාපාර කිරීම, පෞද්ගලිකකරණය කිරීම ආදී ක්‍රමවේද ළිංමැඩි මානසිකත්වයේ සිටින වුන්ට තේරුම් යන්නෙම විකුණනවා ලෙසය. අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ ලෙසය. ඇත්තමට අසනීපය මෙයය.

### ඉන්දියාව නැතුව බැරිවීම

පසුගියදා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මෙරට සංවර්ධන යෝජනා ක්‍රම ගණනාවක් වෙනුවෙන් ඉන්දියාවේ ආයෝජකයන් ගෙන්වාගැනීම වෙනුවෙන් වැදගත් මෙන්ම දැවන්ත පියවරක් ගැනීමද මේ මැටි මොල් ළිං මැඩියන්ට පෙනුනේ රට විකුණාගෙන කෑමක් ලෙසය. ජාතිකවාදී පදනමක සිට ඉන්දියානු විරෝධයක්ද ඒ වෙනුවෙන් යළි ගොඩ නැගීමටද කටයුතු කෙරිනි. එම යෝජනාවලට සමගාමීව ඉන්දියාව සහ ලංකාව යා කරමින් මන්නාරම් ද්‍රෝණිය හරහා රාම සේතු ගොඩබිම් මාර්ගය ඉදිකිරීම ගැන යෝජනාවට කාදිනල් උන්නාන්සේ පරළව ඇත්තේ රට ඉන්දියාවට විකිණීමට යනවා කියන තේරුමෙනි. කාදිනල් දන්නා ආර්ථිකයක් දේශපාලනයක් නැතැයි කියා මේ බහුබූත කතන්දර නිකම්ම කසල ගොඩකට විසිකර දැමිය හැකි වූවත් මෙතැන ඇත්තේ වෙන කතාවකි. ජනාධිපතිවරයාට සහ රජයට එරෙහි වී රට ආරාජිකකර යළි බංකොලොත් කිරීමේ දහදුරා වුවමණාවය. ඒ තමන්ගේ පැවැත්ම, බඩගෝස්තරය වෙනුවෙන් කරන මජර දේශපාලනයයි. මිනිස්සු යථාර්ථය සමඟ අනුගත වෙන තරමට ලෝකය අවබෝධ කරගන්නා තරමට තමන්ගේ ජාරාජීර්ණ තක්කඩි පැවැත්ම අහෝසි වන බව ඕනෑම ආගමික නායකයෙක් දන්නා සත්‍යයය. ජාතිකවාදී සහ වාමාංශික ළිං මැඩියන්ගේ තත්වයද මෙයමය.

ලෝක යථාර්ථය ගැන යම් අවබෝධයක් තිබේ නම් ලංකාවේ අනාගතය පවතින්නේ ඉන්දියාව ප්‍රමුඛව මෙරට මිතුරු රාජ්‍යයන්ගේ සහයෝගය සහ ඒකාබද්ධවීම් සමඟ වන ගමනකදී පමණක් බව පැහැදිලිව පෙනෙනු ඇත. අද ගෝලීය තත්වයන් සැලකීමේදී ඉන්දියාව යනු ගෝලීය වශයෙන් බලවත්ම රාජ්‍යයකි. ලංකාව යනු එදා තිබුණාටත් වඩා පහළ අඩියකට ඇද වැටුණු දුර්වල රාජ්‍යයකි. තනියෙම නැගිටීමට නොහැකි බව ඔප්පු කළ රාජ්‍යයකි. කටවාචාලකම් තිබුණාට උද්දච්චකම් තිබුණාට, පස්ස කහගන්න නියපොත්ත නැති රටක් බවට පත්ව තිබේ. රට බංකොලොත් වී කරකියාගන්න දෙයක් නැතිව සිටියදී බඩගින්නේ නොමැරී සිටීමට ආධාර දුන්නේ, අත හිත දුන්නේ ඉන්දියාව ප්‍රමුඛව විදේශ රාජයයන් කිහිපයක් විසිනි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රටේ ආර්ථිකය යළි සකසා දීමට අවශ්‍ය පියවර නොගත්තා නම් කොහොමටවත් යළි නැගීටීමක් වන්නේ නැත. ජනාධිපති රනිල් වික්‍රමසිංහ නොවන්නට ජාත්‍යන්තරයේ සහය ලබාගැනීමවත් සිදුවන්නේ නැත. මොකද රටේ හිටපු ළිං මැඩියන්ට එහෙමවත් ජාත්‍යන්තරයේ සහය ලබාගැනීමක් ගැන අවබෝධයක් තිබුණේ නැති නිසාය. බාහිර ලෝකය ගැන නොදන්නාකම නිසාම බාහිරෙන් පැමිණෙන දෙයට මේ අය බයය. නමුත් ජීවිතය බේරාගැනීමට නම් ඒ සහය හැර වෙනකක් නොමැති තත්වයන් හමුවේ අවදානම භාරගෙන විශ්වාසයෙන් යුතුව ඒ සහය පැතිය යුතු විය. ඒ සඳහා හයියක් තිබුණේ එක් මනුස්සයකුට පමණි. ඔහු අද එම ව්‍යායාමයෙහි සාර්ථකත්වන් අත්පත් කරගනිමින් සිටී.

### මිනිස්සු ඉල්ලන මාර්ගය

කොහොම නමුත් මේ යන්තම් වලකින් ගොඩ ආවා විතරය. තව බොහො දුරක් යා යුතුව තිබේ. එහෙත් යළි වළේ නොවැටී සිටීමට නම් ජාත්‍යන්තරය සමඟ සහයෝග යෙන් ඉදිරි ගමන යායුතුව තිබේ. ලෝකයට විවෘත විය යුතුය. ලෝකයේ සිව් දිසාවටම මාර්ග විවෘත කරගත යුතුය. සීමාවන් බිඳ දමා සම්බන්ධතා ගොඩනැගිය යුතුය. තාප්ප වෙනුවට පාලම් ඉදි කළ යුතුය. කාදිනල් උන්නාන්සේගේ ආගමික නායකයා වන පාප් වහන්සේ මීට වසර කිහිපයකට පෙර අමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මෙක්සිකෝ දේශ සීමාව හරහා මහා තාප්පයක් බැඳීමට යෝජනා කරන විට ඊට බරපතල ලෙස විරුද්ධ වෙමින් කීවේ භීතිය වපුරන තාප්ප තනන්නේ මිනිසුන් බෙදා කොටු කිරීමට බවය. තාප්ප වෙනුවට පාලම් ගොඩනැගිය යුතු බවත්ය. නමුත් තමන්ගේ ආගමික නායකයා එසේ කීවද කාදිනල් උන්නාන්සේ කියන කතාවේ හරය පාලම් කඩා බිඳ දමා තාප්ප තනා මිනිසුන් මේ දූපත තුළ කොටුකර තැබීම විය යුතු බවය. එහෙම නොකිරීම අසනීපයක් බවය. ඒ අනුව පාප් වහන්සේත් බරපතල අසනීපකාරයෙකි.

රට දිනෙන් දිනම සංවර්ධනයේ යම් යම් ප්‍රතිලාභ අත්පත් කරගනිමින් ඉදිරියට ගමන් කරමින් තිබෙන තත්වයන් හමුවේ මේ ළිං මැඩි කතන්දර පිළිගන්නා මිනිස්සුන්ද ක්‍රමයෙන් ක්ෂය වෙමින් තිබේ. මේ රටට කෙලවී ඇත්තේ මේ ළින් මැඩි තර්ක සහ මෝඩ ක්‍රියාමාර්ග නිසා බවටත් මේ රටේ මිනිස්සුන්ට අවබෝධය ලැබෙමින් තිබේ. මෙවැනි මුග්ධ කතාවලට සමාජයෙන් දැඩි ප්‍රතිචාරයන් අද



ලැබෙමින් පවතින බවත් සමාජ මාධ්‍ය අසුරු කිරීමෙන් පැහැදිලි වැටහීමක් ලබාගත හැකිය. මේ රටේ මිනිස්සු බලා හිඳින්නේ තවදුරටත් දූපතට කොටු වී ළිං මැඩි ජීවිතයක් ගත කිරීමට නොවේ. දූපතෙන් එහා මහා විසල් ලෝකයක් පවතින බව මිනිස්සුට වසං කළ නොහැක. ඒ ලෝකය මේ රටට විවෘත විය යුතුවීම රට වැසියාගේ අභිලාශයය. මිනිස්සු රට අත්හැර යන්න පෙළඹී ඇත්තෙත් රට ලෝකයට විවෘත්ත නොවීම නිසාය. ලෝකය අත්පත් කරගෙන තිබෙන සංවර්ධනය තවදුරටත් ප්‍රමාද නිසාය. කාදිනල් උන්නාන්සේ සිතාගෙන සිටින්නේ මේ රටේ මිනිස්සු තවමත් එක එක ජඩයන්ගේ ගොබ්බ කතා පිළිගන්නා තරමට ළිං මැඩියන් බවය. උන්නානසේ රාම සේතු පාලම ගැන ජනමත විමසුමක් තැබිය යුතු බව කියන්නේ ඒ නිසාය. එවැනි විමසුමක් පැවැතුනහොත් රටේ සාතිශය බහුතරය පාලම තැනිය යුතු බවට කැමැත්ත ප්‍රකාශ කිරීම ගැන සැකයක් නැත. අඩුම තරමින් මෙවැනි කතාවක් කරන්න කලින් තමන්ගේ අහල පහළ සිටින මිනිස්සුන්ගෙන්වත් ඇසුවා නම් මෙච්චරටම ඒ උන්නාන්සේ පීචං වන්නේ නැත.

රටට ලැබෙන විදේශ ආයෝජන, මේ රට විකුණාගෙන කෑමක්ය කියන මරිමෝඩ කතන්දරය අද සිහි බුද්ධියක් ඇති මිනිහෙක් පිළිගන්නේ නැත. ලෝකයට විවෘත නොවීමේ විපාකය අද තමන් විඳින බව බහුතරයක් මිනිස්සුන්ට තේරුමක් තිබේ. මෙය ඉන්දියාවේ හෝ ප්‍රාන්තයක් විය යුතු බවත් ඇතැමුන් කියන්න පෙළඹී ඇත්තේ ද ඒ නිසාය. කොහොම නමුත් මේ ගෙවෙන්නේ රටට විදේශ ආයෝජකයන් වැඩි වැඩියෙන් ගෙන්වා ගත යුතු කාලයකි. රටෙ ආර්ථිකය ගොඩදා ගැනීමට නම් ඒ අත්‍යාවශ්‍යය. ඒ වෙනුවෙන් තිබෙන බාධක අහෝසි කිරීමක් හෝ ලිහිල් කිරීමක් විය යුතුය. පහසුකම් සැලසිය යුතුය. කාර්යක්ෂම කළ යුතුය. නවසිය අනූව දශකයේදී ඉන්දියාව බංකොලොත් වන තත්වය කරා ඇද වැටුණු විට ඉන් ගොඩ ආවේ බරපතල ආර්ථික ප්‍රතිසංස්කරණ නිසාය. ළිං මැඩියන්ගේ කතන්දර පසෙකලා ළිඳෙන් ගොඩ ඒමට පියවර ගත් නිසාය. අද සඳ අල්ලන තරමට ඉන්දියාව ශක්තිමත් වී ඇත්තේ ඒ නිසාය. රට විකුණන්නේ නැතැයි කියමින් විදේශ ආයෝජන වලට ඉඩ දෙන්නේ නැතැයි කියමින් රට වහගෙන හිටියා නම් ඉන්දියාව අදත් ලෝකයේ ලොකුම මුඩුක්කුවක් වීම හැර වෙනකක් වීම වන්නේ නැත. මෑත කාලයේ සංවර්ධනයේ හිණිපෙත්තට නැඟි රටවල් සියල්ලේම කතන්දරය එක හා සමානය. සියල්ල ඒ පෙළහර පැවේ විදේශ ආයෝජන නිසාය. අද කටාර් වැනි රාජ්‍යයක් තමන්ගේ රටේ භූමියේ කොටස් සින්නක්කරව හෝ විදේශ සමාගම්වලට පවරන්නේත්, කිසිදු බදු පැනවීමකටත් යටත් නොකර විදේශ ආයෝජකයන්ට විවෘත කරන්නට තීන්දු අරගෙන ඇත්තේ රටේ සංවර්ධනයට ඇවැසි වේගවත් මාර්ගය විවෘත කරගැනීම වෙනුවෙනි. ඩුබායි රාජ්‍යය ලෝකයේ සුරපුරයක් වන්නේ විදේශ ආයෝජන නිසාය. මලයාසියාව, සිංගප්පූරුව, දකුණු කොරියාව සංවර්ධනයේ ඉහළටම ආවේ විදේශ ආයෝජන නිසාය. තායිලන්තය, ඉන්දුනීසියාව සහ වියට්නාමය ගත්තත් එසේය. දරිද්‍රතාවයෙන්, සිවිල් යුධ තත්වයන්ගෙන් බැට කෑ රාජ්‍යයන්ව පැවැති ඉතියෝපියාව, රුවන්ඩාව වැනි රාජ්‍යයන් දැවැන්ත සංවර්ධනයක් අත්පත් කරගනිමින් සිටින්නේ විදේශ ආයෝජනයන් නිසාය. ලෝකයේ දුප්පත්ම රාජ්‍යයන් විශාල ප්‍රමාණයක් පවතින බටහිර, මධ්‍යම අප්‍රිකානු රාජ්‍යයන් ගණනාවක්ම අද සංවර්ධන යුගයකට පිවිසෙමින් සිටින්නෙ විදේශ ආයෝජන නිසාය.

එහෙත් තවමත් ශ්‍රී ලංකාව ආයොජකයන් ගෙන්වා ගැනීම ගැන බියෙන් සිටී. එසේම ආයෝජකයන්ද මෙරටට පැමිණීමේ බියෙන් පසුවේ. ඒ එල්ලවිය හැකි විරෝධයන්, පීඩාවන් සහ රටට අවේනික දුර්වලතා හා බාධක නිසාය. කොන්ද පණ ඇතිව තීන්දු තීරණ ගත් ජේ.ආර්. ජයවර්ධන යුගයේදී නිදහස් වෙළඳ ආයෝජන කලාප ඇති කරමින් විදේශ ආයෝජකයන් මෙරටට ආකර්ෂණය කරගැනීමට ගත් පියවරයන්ටද එදා මෙරට ළිං මැඩියන් විරුද්ධ විය. විදේශ ආයෝජන ලෙස ඇඟලුම් කම්හල් ඇරඹීමට විරුද්ධ වූයේ සුද්දන්ට ජංගි මහන්න හදන්වා කියමිනි. නමුත් ඒ ජංගි මහන්න එදා තීරණය නොකළා නම් මොකද වෙන්නේ කියන එක අමුතුවෙන් පෙන්වා දිය යුතු නැත. අද රටට වැඩිම විදේශ විනිමයක් ගෙන එන්නේ මේ කියන ජංගි කර්මාන්තයෙනි. විදේශ ආයෝජන ලෙසින් පැමිණ ව්‍යාපාර රට තුළ ඇතිවෙන විට මෙරට පෞද්ගලික අංශයද හරි හරියට එම ව්‍යාපාර ක්ෂේත්‍රයට තරගයක් දෙමින් පිවිසිනි. අද ලෝකයේ නමක් දරාගෙන කරක් ගැසීමට තරම් මෙරට දේශීය ව්‍යාපාර ගණනාවක් මේ නිසා දියුණු විය. විදේශ රටවල ආයෝජනය කරන්න තරම් දියුණු විය. මෙරටට ලැබෙන විදේශ අයෝජනවල වාසිය ඒ මොහොතේ ලැබෙන දෙය පමණක් නොවන බව මෙම ඇඟලුම් කර්මාන්තය බිහිවීම ආශ්‍රයෙන්ම තේරුම් ගත හැකිය. කොළඹ වරාය දියුණු වන විට ඒ ආශ්‍රිතව කර්මාන්ත ව්‍යාපාර විශාල ප්‍රමාණයක් බිහිවිය. අපනයන කර්මාන්ත බිහි වීමට රුකුලක් විය. 70-77 කාලයේ රට වහගෙන නටපු ජෝගිය නිසා එතෙක් පැවැතුන රජයේ කර්මාන්ත අඩක් පමණ විනාශ විය. අපනයන කර්මාන්ත නැත්තටම නැති විය. අපනයන වෙළදාමේ ප්‍රධාන බෝග වූ තේ වගාව සියයට 10කින් පමණත් පොල් වගාව සියයට 15කින් පමණත් හැකිලිණි. පෞද්ගලික අංශය මුළුමන්මනිම අහෝසි වන තැනට පත් විය. නමුත් රට ලෝකයට හැකි පමණින් යළි විවෘත කිරීමට ගත් පියවර නිසා මෙරට දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ පුනර්ජීවනයක් ඇති විය. අපනයනය කිහිප ගුණයකින් දියුණු විය. මෙම කාල සීමාවල සංඛ්‍යා දත්ත පරික්ෂා කිරීමේදී සැබැවින්ම දේශීය කර්මාන්ත, ව්‍යාපාරයන් සීග්‍රව දියුණු වූයේ 77න් පසු යුගයේදී බව තහවුරු කරගත හැකිය. විදේශීය ආයෝජකයන් විශාල ප්‍රමාණයක් මෙරට පැමිණ රටේ සංවර්ධනයට දායකවීම මේ දේශීය ආර්ථිකයේ දියුණුවට හේතු විය. එය එම යුගයේ සුවිශේෂත්වයකි. එදා පටන් ගත් ඒ ගමන, ඒ නියම පාරේ රැගෙන යාමට පසුව පත් වූ පාලකයන් සමත් වූවා නම්, ජනතාව ඊට අනුගත වුවානම් අද මෙහෙම ලියැවිලිවලට ඉඩක් ලැබෙන්නේ නැත. එසේ නම් වියමන් කරන්නට තිබුණේ ලෝකය අල්ලන හැටි ගැනය, සඳ අල්ලන හැටි ගැනය. ඒත් අවාසනාවකට ළිං මැඩියන්ගේ අඳෝනා, ගොන් කතා, පාහරකම්වලට උත්තර බඳින්නට සිදුව තිබේ.

ජයතුංග බණ්ඩාර

# දිනපතා වෙඩි තැබීම්වලින් ගම්‍ය වන්නේ නීතියේ ආධිපත්‍ය බිඳවැටුණු බවක්ද?

## මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස්



පාතාලයේ සිද්ධීන් වැඩිවෙලා තියෙනවා. ඒක මම පිලිගන්නවා. ඉන් බහුතරයක්ම පාතාලයේ එකිනෙකා වෙඩි තබා ගැනීම්. ඒ වගේම සිද්ධීන්වලින් පසු අපි ඔවුන්ව නීතියේ රැහැනට හසුකර ගෙන තිබෙනවා. ඔවුන් ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන යනවා. අපිත් ඒකට හරියන්න අපේ විවිධ ක්‍රියාකාරම් පොලිසිය ද විශේෂ කාර්ය බලකාය ද මෙහෙයවමින් කටයුතු කරනවා. පහුගිය සතියේ කුඩාවැල්ලේ වෙඩි තියපු පුද්ගලයා වගේම කෙසෙල් වත්තේ වෙඩි තියපු පුද්ගලයා අපි අත්අඩංගුවට ගත්තා. මම කියන්න කැමතියි අපි මොන ක්‍රමයකින් හරි මෙම තත්වය මැඩපවත්වනවා. පාතාලේ අයට කියන්න තියෙන්නේ, ඒගොල්ලෝ හිතනවනම් වෙඩි තියලා බේරිලා යන්න පුළුවන් කියලා. කොහෙ හිටියත් අපි ඒ අයව අල්ල ගන්නවා. අල්ලන්න ගියාම අපිටත් වෙඩි තියනවා. එහෙම උනාම අපිත් අනිත් පැත්තට වෙඩි තියනවා. ඒකේ හංගන්න දෙයක් නැහැ. ඒ නිසා අපි අපේ මෙහෙයුම් තදින්ම කරනවා.

එයාලට හිතෙන දේවල් කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. පාතාලය කියන්නේ මත්ද්‍රව්‍යත් සමග යන වැඩ පිළිවෙලක්. ඒක ඉස්සරහට යන්න අපි කොහොමත් ඉඩ තියන්නේ නැහැ. හැබැයි මෙහෙම දේවල් වෙන කොට අපිට පැය විසිහතරෙන් පැය හතලිස් අටෙන්
නවත්වන්න බැහැ. දකුණ පැත්තේ ඒ දවස්වල තිබුණු තත්වයත් සමග අපි සිදුකල මෙහෙයුම් නිසා දැන් දින හැටකට ආසන්න කාලයක් තුළ කිසිම දෙයක් සිදු උනේ නැහැ. දැන් ඊට පස්සේ වෙන තැන්වල පටන් ගෙන තියෙනවා. ඊට අදාළව මම වෙනම කමිටුවත් පත්කලා. ඔවුන් අවශ්‍ය කටයුතු සිදුකරයි.

මේ සිද්ධිවල සුවිශේෂීත්වය තමයි මේ වෙඩි තැබීම් සිදුවන්නේ පාතාල කල්ලි අතරයි. සියයට අනූ නවයක් ගත්තොත්, එක්කෝ කුඩු ප්‍රමාණයට සරිලන මුදල් ලබා දී නැහැ. එහෙමත් නැත්නම් ඒ ඒ කල්ලිවල සාමාජිකයින් ඝාතනය කිරීමේ සිද්ධීන්ට අදාළ පලිගැනීම් මූලික වෙලා තියෙනවා. ඒකෙන් වෙන්නේ ඒ ඒ අය විසින්ම ඒ ඒ අයව ඝාතනය කරගැනීමක්. අප කරන්න ඕන දේවල් ඒ අයම කරගන්න එක. ඒකෙන් වෙන්නේ නීතයේ ආධිපත්‍ය බිඳ වැටීමක් නෙවෙයි. අවුරුදු කිහිපයක ඉදන් මත්ද්‍රව්‍ය වැඩිවීමත් සමග තමයි මෙහෙම වෙලා තියෙන්නේ.

සමහර අවස්ථාව ගතයුතු තීන්දු තීරණ නොගැනීමත් සමග තමයි මෙහෙම වෙලා තියෙන්නේ. ඒ මොකද තියනව නම් යම් සිදුවීමක් ගත්තොත් දාහක් දෙනා ඉන්නවා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්න. ඉතිං ඒ වගේ ප්‍රශ්න හින්දා මේවගේ ඇදි ඇදි ගිහින් තියෙනවා. හැබැයි දැන් එහෙම වෙන්න බෑ. දැං කල යුතු දේ කල යුතුයි. මාස හතරක් පහක් ඇතුළත මේ තත්වය අපි අවසන් කරනවා.

ඒ වගේම රට පුරා පාතාල ක්‍රියාකාරකම් මර්දනයට අවශ්‍ය වැඩපිළිවෙළ දැනටමත් රජය ක්‍රියාත්මක කර තිබෙනවා. වගකිව යුතු රජයක් ලෙස සාමාන්‍ය ජන ජීවිතයට හානියක් වන කිසිදු ක්‍රියාකාරකමට රජය කිසිවෙකුටත් ඉඩ තබන්නේ නැහැ.



# අස්වැසුමට ව්‍යාජ තොරතුරු ලබා දී තිබුණොත් මුදල් නැවත අය කරගන්නේ කොහොමද?

## මුදල් රාජ්‍ය අමාත්‍යෂෙහාන් සේමසිංහ

රුවි අරුචිකම් මත ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමය අපි අවසන් කලා. අස්වැසුම සදහා ජනාතාව තෝරාගෙන තියෙන්නේ කිසිදු දෙවන පාර්ශවයක මැදිහත්වීමකින් තොරවයි. අපි අස්වැසුම තුලින් සිදු කරන්නේ, ඉතාමත් විනිවිදභාවයකින් යුක්ත තෝරාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම. එමගින් ඔවුන්ට තමන්ට ගැලපෙ ආකාරයේ ජීවිකාවක් ගෙන යන්න පුළුවන්. අස්වැසුමට අමතරව අපි වැඩිහිටි දීමනාව, වකුගඩු දීමනාව, ආබාදිත පුරවැසි දීමනාව අවසන් කරලා තියෙනවා.

දීමනාව ලබාදීමත් සමගම ඔවුන්ව සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය අදාළ අමාත්‍යංශය විසින් සිදු කිරීමට නියමිතයි. ඉතිං අපි අස්වැසුම තුළින් සිදුකරන්නේ අතීතයේ අත්විදපු රුවි අරුචිකම් මත ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමය අවසන් කොට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සිදුකිරීමයි. අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබූ පළමු කණ්ඩායම සඳහා මුදල් ලබාදීමට රජය කටයුතු කලා. එයින් ප්‍රතිලාභී පවුල් 689,803ක් මේ වනවිට තම ගිණුම්වලට මුදල් ලබාගෙන තිබෙනවා. එය රුපියල් බිලියන 4.395ක් පමණ වෙනවා. සමස්තයක් ලෙස අස්වැසුම සඳහා ප්‍රතිලාභි පවුල් ලක්ෂ 15ක් සුදුසුකම් ලබා තිබෙනවා. තවත් පවුල් ලක්ෂ 10ක් ඉල්ලූම්පත් යොමු කර තිබෙනවා. විරෝධතා යොමු කළ පවුල් ගණන ලක්ෂයක් පමණ වෙනවා. මේ සියල්ල සලකා බලා සමස්තයක් ලෙස අස්වැසුම සඳහා ප්‍රතිලාභි පවුල් ලක්ෂ 20ක් තෝරා ගැනීමට කටයුතු කරනවා. අඩුආදායම් ලාභී පවුල් ලක්ෂ 20ක් සඳහා මෙම අස්වැසුම වැඩසටහනෙන් ප්‍රතිලාභ ලබාදීමට පාර්ලිමේන්තුවෙන් අනුමැතිය හිමිව තිබෙනවා.

දැන් මෙම පළමු කණ්ඩායම වෙනුවෙන් අප මුදල් මුදා හැර තිබෙනවා. දෙවන කණ්ඩායමට මේ සතියේදී මුදල් ලබාදීමට සැලසුම් කර තිබෙනවා. මේ පිළිබඳ යම් ගැටලුවක් හෝ දැනගැනීමක් සිදු කිරීමට අවශ්‍ය නම් 1924 දුරකතන අංකය මඟින් තොරතුරු ලබා ගැනීමේ අවස්ථාවත් හිමිකරලා දීල තියෙනවා. මේ ලබාදෙන මුදල් අප ලබාදෙන්නේ ජූලි මාසයට අදාළවයි. ඉදිරියේදී අගෝස්තු මාසයට අදාළ මුදල් ලබාදීමට කටයුතු කරනවා. අස්වැසුම ප්‍රතිලාභ කිසිදු මාසයක් මගනොහැර ලබාදෙනවා. අස්වැසුම ලබාදෙන්නේ අනෙක් වැඩිහිටි දීමනා, අබාධිත දීමනා ලබාදෙන අතරවීම විශේෂත්වයක්.

සමෘද්ධි ආයතනය මඟින් මෙම පවුල් සවිබලගැන්වීම සිදු කරනවා. අස්වැසුම ප්‍රතිලාභීන් පවා සවිබල ගැන්වීම සිදු කරනවා. මක්නිසාදයත් ලබන වසරේ දී නැවත අස්වැසුම සඳහා ඉල්ලූම් කළ යුතුයි. එක කණ්ඩායමකටම අඛණ්ඩව මෙම ප්‍රතිලාභ ලබා දීම සිදු වන්නේ නැහැ. අස්වැසුම ලබාදෙන්නේ ප්‍රතිලාභ අවැසිම පවුල්වලට පමණයි.

ජනතාව සවිබල ගැන්වීමෙන් පසුව ප්‍රතිලාභ අවශ්‍ය වන්නේ නැහැ. ඒ වගේම කිසිවෙකු හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර අස්වැසුම ප්‍රතිලාභ ලබාගෙන තිබෙනවා ද කියා අප සොය බලනවා. කිසිවෙකු හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ප්‍රතිලාභ ලබාගෙන තිබුණහොත් එය නැවත අයකරගැනීමේ ක්‍රමවේදයක් අස්වැසුම පනතෙන්ම තිබෙනවා. ඒ අනුව ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ලබාගත් මුදල් නැවත අය කරගන්නවා. ඉන්පසුව අස්වැසුම පොරොත්තු ලේඛනයේ සිටින ඊළඟ ප්‍රතිලාභියාට අවස්ථාව ලබාදෙනවා.

සටහන
අසන්ත බණ්ඩාර

# 2024 ජනාධිපතිවරණය

## රනිල් සමඟ පෙරමුණක් රාජපක්ෂලා පවුලට සීමාවෙයි

## අනුර, ඩලස් හා විමල් තුන් හවුලක සජිත් තරගයෙන් ඉවතට

මේ වන විට රටේ දේශපාලනය පෙළ ගැසෙමින් තිබෙන්නේ ඉදිරි ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන බව පැහැදිලිය. විශේෂයෙන්ම විපක්ෂයේ දේශපාලන පක්ෂ තම තමන්ගේ කඳවුර ලකුණු කරගැනීම වෙනුවෙන් වෙහෙසෙමින් සිටින අතර ජනාධිපති රනිල් වික්‍රමසිංහ රටේ ආර්ථික අර්බුදය විසඳීම වෙනුවෙන් බරපතල මෙහෙයුමක යෙදී සිටී.

එහෙත් නවතම තත්වයන් විසින් පෙන්වා දෙන්නේ ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රමුඛ කරගත් පුළුල් දේශපාලන කඳවුරක් නිර්මාණය වෙමින් තිබෙන බවය. මේ වන විට දේශපාලන ආරංචි පවසන්නේ ජනාධිපතිවරයාට සහය දැක්වීමට එක්සත් ජාතික පක්ෂය සහ ඒ සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක වන පක්ෂ සහ කණ්ඩායම් රැසක් ජනාධිපතිවරයාගේ සහයට ඒකරාශී වෙමින් සිටින බවය. මේ අතර පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රබලයන් ගනනාවක්ම කණ්ඩායමක් ලෙස ඔහුට සහය දැක්වීමට තීරණය කර තිබේ. එමෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයද හිමිවනු ඇතැයි එම පක්ෂයට සම්බන්ධ තොරතුරු මාර්ග පෙන්වා දෙයි. සමගි ජන බලවේගයේ බහුතර මන්ත්‍රී පිරිස ජනාධිපතිවරයාට සහය දීමට ඉදිරිපත්ව සිටින බව මේ වන විට තහවුරුව ඇත. සමගි ජන බලවේගයෙන් ඉවත් වූ පාඨලි චම්පික රණවකගේ එක්සත් ජනරජ පෙරමුණද මේ වෙනුවෙන් එකතු වෙනු ඇති බව දැනගැනීමට ඇත. එසේම දෙමළ හා මුස්ලිම ප්‍රජාව නියෝජනය කරන පක්ෂ හා කණ්ඩායම් ගනනාවක්ම ජනාධිපතිවරයාගේ සහයට පැමිණෙන ඇති බව ද පැවසේ. මෙහි විශේෂත්වය වන්නේ ජනාධිපතිවරයා අනුගමනය කරන ප්‍රතිපත්තිමය තීරණයන් තුළ මෙතෙක් ගත් ක්‍රියාමාර්ගයන්හි සාර්ථකත්වය සහ ඉදිරි දේශපාලන හා ආර්ථික ක්‍රියාමාර්ග යන් වඩාත් පැහැදිලිව සහ ඉලක්කයක් සහිතව ඉදිරිපත් කිරීම තුළ වන එකඟතාවයන් මත මෙම සහය හිමිවීමය.

මේ අතර පොදුජන පෙරමුණ කණ්ඩායම් ගණනාවකට කැඩී වෙන්වී දුර්වලව තිබෙන තත්වයන් හමුවේ වුව එම පෙරමුණේ රාජපක්ෂවාදීන් තමන්ගේ වන අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට තීරණය කර ඇති බව එම පක්ෂයට සම්බන්ධ තොරතුරු මාර්ග පවසයි. ඉදිරි ජනාධිපතිවරණ අපේක්ෂකත්වයට නාමල් යෝජනා කර ඇත්තේ සිය පවුලේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයා වන චමල් රාජපක්ෂය. එහෙත් එම යෝජනාවට සහයෝගය දක්වන පිරිස සීමිත වන නිසා තවමත් අවසන් තීරණයක් ගෙන නොමැත. එසේම එළැඹෙන මැතිවරණ සටනට නායකත්වය සපයන්නේ නාමල් රාජපක්ෂ විසින් බවත් එම තොරතුරු මාර්ග පවසයි. කෙසේ නමුත් මෙම රාජපක්ෂ පවුලේ සටනට වෙනත් දේශපාලන පක්ෂවල සහය මෙතෙක් ලැබී නැති බවත් දැන ගැනීමට තිබේ.

ප්‍රථමයෙන්ම තම අපේක්ෂකත්වය ගැන ප්‍රසිද්ධ කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වෙනු ඇති අතර ඔහුගේ සහයට ඩලස් අලහප්පෙරුමගේ මෙහෙයවීමෙන් පොදුජන පෙරමුණෙන් වෙන්වූ මන්ත්‍රී කණ්ඩායම ඉදිරිපත් වීමට නියමිතය. ඒ අතර ඇතැම් තොරතුරු මාර්ග පවසන්නේ විමල් වීරවංශගේ ජාතික නිදහස් පෙරමුණද අනුර කුමාරගේ මැතිවරණ සටනට සම්බන්ධ වෙනු ඇති බවය. මේ සඳහා වන සාකච්ඡා කිහිපයක්ද තෙවන පාර්ශ්වයක් හරහා සිදුකෙරෙමින් පවතින බවද පැවැසේ. ඒ අනුව අනුර, ඩලස් සහ විමල්ගේ නායකත්වයෙන් යුතු තුන් හවුලකින් ඉදිරි ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීමට නියමිතය.

කෙසේ නමුත් මෙම තත්වයන් සමඟ, ජනාධිපතිධුරය අත්පත් කරගැනීම වෙනුවෙන් දිගු කලක් පුරා බලා සිටි සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස නිශ්චිතවම මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් නොවෙන බව එම පක්ෂයට සම්බන්ධ ප්‍රබලයන් පෙන්වා දෙයි. විපක්ෂයේ සන්ධානයක් ගොඩනැගීම වෙනුවෙන් පසුගිය සමයේ වෙහෙසුනත් ඒ සියල්ල අසාර්ථක වූ අතර මේ වන විට පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමවත් රැකගැනීමට ඔහුට නොහැකි වී ඇති බවත් ඔවුන් පවසයි.

# යූනුස්ට එරෙහි චෝදනා ඉවත්කරන ලෙස ගෝලීය නායකයන්ගෙන් හසීනාට ඉල්ලීමක්

නොබෙල් ත්‍යාගලාභීන් ඇතුළු ලොව පුරා නායකයින් 170කට වැඩි පිරිසක් මහාචාර්ය මුහම්මද් යුනුස්ට එරෙහිව ගෙන තිබෙන නීතිමය ක්‍රියාමාර්ග නවත්වන ලෙස බංග්ලාදේශ අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ. ඔහු 2006දී නොබෙල් සාම ත්‍යාගය දිනා ගත්තේ දුප්පතුන්ට උපකාර කිරීම සඳහා ක්ෂුද්‍ර ණය ලෙස හැඳින්වෙන කුඩා ණය ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම වෙනුවෙන් ඔහු ඉටු කළ කාර්යභාරය වෙනුවෙන් ය.



මේ සම්බන්ධයෙන් ලිපියක් යොමු කරමින්, හිටපු ජනාධිපති බැරක් ඔබාමා, හිටපු එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කී මූන් වැනි නායකයින්, ඇතුළු පිරිස බංග්ලාදේශයේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ මානව හිමිකම්වලට ඇති තර්ජන ගැන කනස්සල්ල පළ කර ඇත.

එම ලිපියේ සඳහන් වූයේ, නොබෙල් සාම ත්‍යාගලාභී මහාචාර්ය මුහම්මද් යුනුස්ට චෝදනා කරමින් ගෙන තිබෙන පියවර ගැන ඔවුන් කනස්සල්ලට පත්ව සිටින බවත්, අසාධාරණ යැයි අප විශ්වාස කරන නීතිමය ගැටලුවලට ඔහුට මුහුණ දීමට සිදුවීම ගැනත් කනස්සල්ලට පත්ව සිටින බවත්ය. එසේම ගැඹුරු සමාලෝචනයක් සිදු වුවහොත් ඔහු නිර්දෝෂී බව ඔප්පු වනු ඇතැයි ඔවුහු විශ්වාස කරන බවත් දන්වා ඇත.

අගමැතිනි ෂීක් හසීනා පිළිතුරු දෙමින් කියා සිටියේ යුනුස්ට එරෙහි නීතිමය නඩු විභාග කිරීමට බංග්ලාදේශයට පැමිණෙන වෙනත් රටවල විශේෂඥයින් සහ නීතිඥයින් සාදරයෙන් පිළිගන්නා බවයි. එසේ පැමිණෙන්නේ නම් මින් පෙර නොදුටු සහ නොඇසූ තවත් තොරතුරු හෙළි වනු ඇතැයි ඇය විශ්වාස කරන බවයි.

1983 දී යුනුස් ග්‍රාමීන් බැංකුව ආරම්භ කළ අතර එය සාමාන්‍ය බැංකුවකින් ණය ලබා ගත නොහැකි පුද්ගලයින්ට කුඩා ණය ලබා දෙයි. දුප්පතුන්ට උපකාර කිරීමේදී මෙම බැංකුවේ සාර්ථකත්වය තවත් බොහෝ රටවල එවැනි උත්සාහයන් සඳහා පෙළඹීමක් ඇති කළේය.

කෙසේ වෙතත්, 2008 බලයට පත් වූ දා සිට හසීනාගේ රජය යුනුස් ගැන පරීක්ෂණ ආරම්භ කළේය. 2007 දී ඔහු දේශපාලන පක්ෂයක් ආරම්භ කරන බව පැවසූ විට ඇය කෝපයට පත් වූවාය, ඒ මිලිටරි පිටුබලය ලබන රජයක් විසින් රට පාලනය කර ඇය සිරගතව සිටි කාලයකය. නමුත් ඔහු පක්ෂයක් හැදුවේ නැත. නමුත් මෙය ඇයව කලබලයට පත් කළේය.

යුනුස් බංග්ලාදේශයේ දේශපාලනඥයන් විවේචනය කර ඇත්තේ ඔවුන් මුදල් ගැන පමණක් සැලකිලිමත් වන බව පවසමිනි. හසීනා ඔහුට චොදනා කරමින් කියා සිටියෙ ග්‍රාමීන් බැංකුව හරහා දුප්පත් කාන්තාවන්ගෙන් ණය ආපසු ලබා ගැනීමට බලහත්කාරයෙන් කටයුතු කළ බවය.

හසීනාගේ රජය 2011 දී බැංකුවේ වැඩ ගැන සොයා බැලීමට පටන් ගත් අතර විශ්‍රාම ගැනීම පිළිබඳ නීති කඩ කරමින් යූනුස් 2013 දී බැංකුවෙ සේවයෙන් පහ කළේය. ඔහුගේ නොබෙල් ත්‍යාග මුදල සහ පොත් මගින් ලැබෙන කර්තෘ භාගය ඇතුළුව අවසරයකින් තොරව මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කර ඔහුව නඩු විභාගයකට ලක් කරන ලදී.

පසුව, ඔහු විසින් නිර්මාණය කරන ලද අනෙකුත් සමාගම් ගනුදෙනු සම්බන්ධයෙන්ද ඔහුට තවත් චෝදනා එල්ල විය. කම්කරු නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ඔහුට ඒරෙහිව නඩු පැවරිණි. ග්‍රාමීන් ටෙලිකොම් ආයතනයෙන් අයථා ලෙස මුදල් ගත් බවටද ඔහුට එල්ල වන තවත් චෝදනාවක් විය.

ගෝලීය නායකයින් සිය ලිපියෙන් තවදුරටත් ඉල්ලා සිටියේ ජනවාරි මස මුලදී සිදුවනු ඇතැයි අපේක්ෂා කරන බංග්ලාදේශයේ මැතිවරණය සාධාරණ එකක් විය යුතු බවය. නමුත් මැතිවරණය අවංකව සහ සාදාරණ වන බවට හසීනා ඔවුන් පොරොන්දු වී ඇත.

හිටපු අගමැතිනී කලීදා සියාගේ නායකත්වයෙන් යුත් ප්‍රධාන විරුද්ධ පක්ෂය කියා සිටින්නේ මැතිවරණය අසාධාරණ වනු ඇති බවත්, හසීනා අගමැති ධුරයෙන් ඉවත් නොවන්නේ නම් තම පක්ෂය මැතිවරණයට සහභාගී නොවන බවත්ය. එහෙත් හසීනා මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

නිරෝෂන් පෙරේරා

# අමරිකාවේ අරගල කළ Proud Boys නායකයන් ඇතුළු 600කට සිරදඬුවම්

අන්තවාදි දේශපාලන මත දරමින් කටයුතු කරන අමරිකාවේ "ආඩම්බරකාර කොල්ලන්, (Proud Boys) කණ්ඩායමේ හිටපු නායකයෙකුට වසර 17ක සිර දඬුවමක් එක්සත් ජනපද අධිකරණය විසින් ලබා දී ඇත. මෙම දඬුවම සඳහා පාදක වන්නේ ඔහු එක්සත් ජනපද කැපිටල් කාර්යාල පරිශ්‍රය වෙත ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් ඉටු කළ බැවිනි. (එක්සත් ජනපද කැපිටල් කාර්යාලය යනු එක්සත් ජනපද ෆෙඩරල් රජයේ ව්‍යවස්ථාදායක ශාඛාවේ නිවහනයි. මෙය වොෂින්ටන් ඩී.සී.හි, කැපිටල් හිල්හි පිහිටා ඇත. ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය සහ නීති නිර්මාණය කිරීමට, වාද විවාද කිරීමට සහ සම්මත කිරීමට කොන්ග්‍රසය රැස්වන ස්ථානය ද මෙය වේ. ප්‍රසිද්ධ රොටුන්ඩා සහ ජාතික ප්‍රතිමා ශාලා එකතුව, ඇතුළුව වැදගත් ඓතිහාසික කෞතුක වස්තු සහ කලා කෘති ද කැපිටල්හි තැන්පත් කර ඇත.) මෙම ප්‍රහාරය 2020 නොවැම්බර් ජනාධිපතිවරණයේ ප්‍රතිපල නිකුත්වීමෙන් පසුව සිදු වූ අතර එය ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ සිට ජෝ බයිඩන් වෙත සාමකාමී බලය මාරු කිරීම නැවැත්වීම ඉලක්ක කරමින් දියත් කරවන ලද්දකි.



ප්‍රවුඩ් බෝයිස් සංවිධානයේ එවකට හිටපු නායකයකු වන ජෝසප් බිග්ස් නම් පුද්ගලයා එහි සාමාජිකයන් සමඟ එක්සත් ජනපද කැපිටල් ගොඩනැගිල්ල වෙත පෙළපාලි යාම සංවිධානය කිරීම සහ ඒ සඳහා ප්‍රචණ්ඩ පෙළඹවීම කළේය. මෙය සිදු වූයේ 2021 ජනවාරි 6 වනිදාය. බිග්ස් සහ අනෙකුත් ආඩම්බරකාර කොල්ලන් සංවිධානයේ සාමාජිකයන් විශාල පිරිසක් පොලිස් මාර්ග බාධක බිඳ දමා කැපිටල් ගොඩනැගිල්ල වෙත කඩා පැන නීති සම්පාදකයින් බිය වැද්දීම හේතුවෙන් ජීවිතාරක්ෂාව වෙනුවෙන් ඔවුන්ට පළා යාමට සිදු විය. මෙහිදී බයිඩෙන් මැතිවරණය ජයග්‍රහණය කළ බවට කොන්ග්‍රසය තහවුරු කරමින් සිටි රැස්වීමක් මෙම කාණ්ඩායම විසින් කඩාකප්පල් කර තිබිණි.

තමන්ගේ දඬුවම නියම කිරීමට පෙර බිග්ස් විනිසුරුවරයාට පැවසුවේ, **"මම එදා අවුල් ඇති කළ බව මම දනිමි, නමුත් මම ත්‍රස්තවාදියෙකු නොවේ."** යනුවෙනි.

දීර්ඝ නඩු විභාගයකින් පසු මැයි මාසයේදී ජූරි සභාවක් විසින් වරදකරුවන් කරවූ තවත් ප්‍රවුඩ් බෝයිස්හි සාමජිකයන් හතර දෙනෙකුට විනිසුරුවරයා ඉදිරියේදී දඬුවම් නියම කරනු ඇත. ප්‍රවුඩ් බෝයිස්හි තවත් නායකයෙකු වන එන්රික් ටැරියෝට ලබන සතියේ දඬුවම් නියම වනු ඇත. විනිසුරුවරයා අසනීප වූ බැවින් මෙම සතියේ නඩුව කල් තැබීය.

බිග්ස් ෆ්ලොරිඩාවේ ජීවත්ව සිටි අතර ඔහු කලක් එක්සත් ජනපද හමුදාවේ සිටියේය. පසුව ඔහු අන්ත දක්ෂිණාංශික කුමන්ත්‍රණ න්‍යායන් පතුරවන වෙබ් අඩවියක වාර්තාකරුවෙකු ලෙසද කටයුතු කළේය.

බිග්ස් සහ අනෙකුත් සාමාජිකයන් රැසක් කැරැල්ලක් ආරම්භ කිරීම ඇතුළු බරපතල චෝදනාවලට වැරදිකරුවන් විය. එමෙන්ම 2020 මැතිවරණය ප්‍රතිඵල වංචාකරන ලද බවට ට්‍රම්ප් විසින් ප්‍රකාශ කරන ලද බොරුව, අන්ත දක්ෂිනාංශික අන්තවාදී කොටස් විශ්වාස කරන ආකාරය ද මෙම නඩු විභාගය තුළදී පෙන්නුම් කළේය.

චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතීඥයින් තර්ක කළේ ට්‍රම්ප්ට සහය දුන් කැපිටල්හි වෙනත් පිරිස් විසින් සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් රජය තම සේවාදායකයින් වන ප්‍රවුඩ් බෝයිස් නායකයන්ට දොස් පවරන බවයි.

කෙසේ වෙතත් කැපිටල් ප්‍රහාරයට සම්බන්ධ අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයන් 1100කට වැඩි පිරිසකට මේ වන විට චෝදනා එල්ල වී තිබෙන අතර ඔවුන්ගෙන් 600කට වැඩි පිරිසක් වැරදිකරුවන් වී දඬුවම් ලබා ඇත.

නිරෝෂන් පෙරේරා

# මචං මනෝ!



තුෂාරා සෙව්වන්දි විතාරණ
'ද ලීඩර් සංස්කාරක'

තාරුණ්‍යය වත්මන් කියවීම් තුළ අවිනිශ්චිත වූත්, අපැහැදිලි වූත් චිත්‍රයක් ඇති බව ඔහුගේ කියවීම් තුළ වඩ වඩා අපි කියවා ගත්තේය. එය ඩිජිටල්කරණ අවකාශය තුළ වර්තමානයට වඩා දැන උගත් වියත් පිරිස් විසින් තම සම්භාව්‍ය ගණය ප්‍රාථමිකත්වයට ගොනු කොට ගෙන සැරිසැරීම විසිනැයි ඔහු කීවේය. එසේම කුමන අදියරක පැවැතියද කියවීම විසින් ගොඩ නගන අලුත් පරපුරක්, සංකල්පයක් පවතින කාල සීමාව යුගයක් ලෙස මිස කාල ඡේදයන් ලෙස නොවන බව ඔහු කීවේය. මේ කියවීම් අර්ථ ගැන්වූ ඔහු මනෝරම වීරසිංහය.

'සාහිත ලොව කුරුළු ඇසින්' වැනි පොත්පත් ලියූ, තම පියාගේ අඩිපාරේ යන පුතණුවෙකු වන මනෝරම පොත් කිහිපයක් එළිදක්වා ඇති අතර මේ ඩිජිටල්මය ආඛ්‍යාන කියවන්නා විටෙක සමාජ තලයේ ප්‍රශ්න සම්බන්ධයෙන් තම හඬ අවදි කරන්නේය. අරගල කරන්නේය. ඍජුව තම අදහස සනිටුහන් කරන මොහු තාරුණ්‍යයට වඩා වැඩි පන්නරයක් සපයන්නෙකි. ඔහු චැතම් ටී.වී. යූ ටියුබ් චැනලය මඟින් විකාශනය වන ශානුක කරුණාරත්න විසින් මෙහෙය වන "මචං" වැඩසටහන සමග එක්ව කළ කතා බහෙන් ඔහු පිළිබඳ වඩා වැඩි කියවීමක් ලැබීමට ඔබව යොමු කරන්නේය.

චැතම් ස්ට්‍රීට් යූ ටියුබ් නාලිකාව වෙනුවෙන් කළ "මචං" වැඩසටහනේ පසුගිය කොටස් නැරඹීමට මෙම QR කේතය Touch හෝ Scan කරන්න









පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී